# අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ "හෙජමනිය හෙවත් ආධිපත්‍ය" සංකල්පය පිළිබඳ විචාරාත්මක විශ්ලේෂණයක්

# Critical Analysis on Antonio Gramsci's "Hegemony"

*"I'm alive, I take sides hence I detest whoever does not. I hate indifference."*

*(From a piece of a letter written by Antonio Gramsci to his sister-in-law Tatiana)*

එම්. එච්. ඩබ්ලිව්. එම්. ප්‍රනාන්දු[1], සී. පී. එම්. ගුණවර්ධන[2]
[1 2]සමාජ විද්‍යා **අධ්‍යයනාංශය**
කොළඹ විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව
[2]chamalie@soc.cmb.ac.lk

---

**සාරසංක්ෂේපය**

සමාජය සහ දේශපාලනය සම්බන්ධයෙන් සාම්ප්‍රදායික මාක්ස්වාදී රාමුව අතික්‍රමණය කරමින් ඊට බහුමානීය සංස්කෘතික මුහුණුවරක් එකතුකිරීමේ පළමු ගෞරවය ලබන්නේ අන්තෝනියෝ ග්‍රාම්ස්චි ය. සමකාලීන ශාස්ත්‍රීය ලෝකය වෙත ග්‍රාම්ස්චිගේ රචනා විසින් අතිශය බරපතල අන්දමේ බලපෑමක් සිදු කරයි. මෙම ලිපියෙහි මූලික අවධානය යොමුවන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ සංකල්පය කෙරෙහි ය. ක්‍රමවේදීමය වශයෙන් අන්තර්ගත විශ්ලේෂණයක් මත පදනම් ව ලිපිය රචනාකර ඇත. මෙහි මුඛ්‍ය අරමුණ වූයේ හෙජමනිය යන සංකල්පය ශාස්ත්‍රීය කතිකාව තුළ ස්ථානගතවන ආකාරය පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් සිදු කිරීම යි. හෙජමනිය යන සංකල්පය බහුමානීය පැතිකඩ සහිත සංකල්පයක් වන අතර එමඟින් ප්‍රායෝගික දේශපාලන ක්‍රියාකාරිත්වය කෙරෙහි මඟපෙන්වීමක් මෙන් ම ශාස්ත්‍රීය ලෝකය වෙත ක්‍රමවේදීමය යතුරක් සහ සංකල්පීමය රාමුවක් සපයනු ලැබේ. බහුවිධ සමාජ ප්‍රපංච වටහාගැනීමට මෙන් ම සමස්තයක් ලෙස බලයෙහි ගතිකතා පිළිබඳ එක්තරා සංයුක්ත චිත්‍රයක් ගොඩනගා ගැනීමට හෙජමනිය යන සංකල්පය උපකාරී වේ. හෙජමනියෙහි පවතින සුවිශේෂී ලක්ෂණය වන්නේ පාලිත පිරිස් විසින් සිය එකඟත්වය මත පාලනය වෙමින් එය ව්‍යුහාත්මක සහ භෞතික පැවැත්මක් දක්වා විස්තාරණය වීම යි. හෙජමනිය පිළිබඳ සාකච්ඡාව ඉතා පුළුල්වන්නේ එහි ඇති න්‍යායාත්මක සහ ප්‍රායෝගික සංකීර්ණතා ලඝු කරගැනීම පහසු කාරණයක් නොවන බැවිනි. එනිසා ම හෙජමනිය පිළිබඳ සාකච්ඡාව විසිරුණු ස්වභාවයක් ගන්නා අතර ම එය වටහා ගැනීම සඳහා පුළුල් පරිචයක අවශ්‍යතාව ඉස්මතු කරයි.

***මුඛ්‍ය පද*** *: හෙජමනිය, එකඟත්වය, මර්දනය, බලය, පාලනය*

## Abstract

Antonio Gramsci receives the first honour for augmenting a multidimensional aspect through transgression of the traditional Marxist perspective on society and politics.

Gramsci's writings could greatly influence the contemporary academic domain/ circle. This article aims to discuss the Gramsci's concept of Hegemony and methodologically this article is presented based on a content analysis. The main objective of the article is to critically analyse how the hegemony as a concept is located in the academic discourse. Having a multidimensional interpretation to its core, the concept of hegemony postulates the practical political agendas while providing a new methodological lever and a conceptual framework to the academic readings. The concept hegemony supports to identify the multi-level social phenomena and dynamics of power with a combined picture. The significant character of hegemony is that the ruled is being ruled with their consent and this consent expands its physical and structural existence. The discussion on hegemony is exceptionally broad as it is difficult to abridge its practical and theoretical complications. Thus, the conversation of the concept of hegemony is indeed pervasive and it needs an extensive effort to identify the wholeness.

**Keywords**: Hegemony, consent, repression, power, rule

## 1. හැඳින්වීම

මාක්ස්වාදී පර්යාලෝකය පොදුවේ ශාස්ත්‍රාලයීය ශික්ෂණය මෙන් ම ප්‍රායෝගික දේශපාලන ක්‍රියාකාරිත්වය තුළ ද, දැනුදු වඩා බලපෑම්සහගත න්‍යායික ධාරාවක් වේ. එහි දී සම්භාව්‍ය මාක්ස්වාදය විසින් සිය විග්‍රහයේ කේන්ද්‍රීය අක්ෂය "ආර්ථික නියතිවාදය" මඟින් සනිටුහන් කරන නමුත් මෙම ගුරුකුලය තුළ ම වන පශ්චාත්කාලීන වර්ධනයන් වෙතින් "ආර්ථික නියතිවාදය" තවදුරටත් ඒ අයුරින් පිළිගනිමින් නමුදු වඩා සංයුක්ත සහ පෘථුල කියවීමක් වෙත විතැන්වීමක් විද්‍යමාන වෙයි. එකී විතැන්වීමේ සමාරම්භක ලක්ෂ්‍යයන් සනිටුහන් කරන නව මාක්ස්වාදී න්‍යායධරයින් අතර අන්තෝනියෝ ග්‍රාම්ස්චි, ලුවී අල්තූසර්, ගුන්ඩා ෆ්‍රැන්ක්, වැන්නෝ කැපී පෙනෙති (Peet and Hartwick, 2009). තව ද විචාරාත්මක ගුරුකුලය විසින් ද මෙම ආර්ථික නියතිවාදයෙන් ඔබ්බට මාක්ස්වාදී අදහස් සහ සමාජය පිළිබඳ සිය විශ්ලේෂණය ගමන් කරවයි. එතෙක් පැවති දෘඪ භෞතිකවාදී, ආර්ථික කේන්ද්‍රීය පන්ති විග්‍රහය වෙනුවට සංස්කෘතිය, මතවාද, බලය, මනෝමූල සාධක පිළිබඳ සැලකිය යුතු උනන්දුවක් මෙම නව ප්‍රවණතාව විසින් මාක්ස්වාදී න්‍යාය සහ ඒ පිළිබඳ උනන්දු වන ලෝකය වෙතට එන්නත් කරන බව ශ්ලේෂණය කළ හැකි වැදගත් තත්ත්වයකි. එකී ව්‍යාපෘතියේ වඩා වැදගත් සහ බලපෑම්සහගත සන්ධිස්ථානයක් ඉතාලියානු ජාතික නව මාක්ස්වාදීයෙකු, ව්‍යූහවාදියෙකු වන අන්තෝනියෝ ග්‍රාම්ස්චි විසින් සලකුණු තබනු ලබන අතර ඔහුගේ හෙජමනිය හෙවත් ආධිපත්‍ය, දෘෂ්ටිවාදය, බුද්ධිමතුන්, සමාජ පන්තිය පිළිබඳ විග්‍රහය, දේශපාලනය තුළ මතවාදීමය තලයෙහි වැදගත්කම, සිවිල් සමාජය සහ රාජ්‍යය වැනි සංකල්ප පිළිබඳ විග්‍රහයන් මාක්ස්වාදය පිළිබඳ ව ශාස්ත්‍රීය ව උනන්දුවන්නන්හට නව මංපෙත් විවර කරයි. සිංහල භාෂාවෙන් ග්‍රාම්ස්චි හෝ ඔහු ඉදිරිපත් කරන සංකල්ප පිළිබඳ ලියවුණු ශාස්ත්‍රීය රචනාවන්ගේ පැහැදිලි හිඟයක් පවතී. මෙම ලිපිය ස්ථානගතවන්නේ එම ශාස්ත්‍රීය රික්තය හඳුනා ගනිමින් ඊට බුද්ධිමය දයකත්වයක් ලබාදීමේ උත්සාහයක් ලෙස යි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

න්‍යායික සහ ප්‍රායෝගික පැතිමාන ද්විත්වය තුළ ම ග්‍රාම්ස්චියානු මැදිහත්වීමේ වැදගත්කම අවධාරණය කරන මෙම ලිපියේ මූලික අරමුණ වන්නේ ඔහුගේ "හෙජමනිය (Hegemony) හෙවත් ආධිපත්‍ය" යන සංකල්පය පිළිබඳ විශ්ලේෂණයක් සිදු කිරීම යි. එහි දී හෙජමනිය සංකල්පය හුදෙක් වියුක්ත අර්ථයෙන් නොව තත්කාලීන දේශපාලන අවකාශය සහ ග්‍රාම්ස්චියානු ස්වයං දේශපාලනයේ සංයුක්ත තත්ත්වයක් වශයෙන් සලකමින් ශාස්ත්‍රීය කතිකාව තුළ එහි ස්ථානගත වීම හඳුනා ගනී. අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය අධ්‍යයන ක්‍රමවේදය ලෙස භාවිත වූ අතර තේමා පාදක කරමින් සාකච්ඡාව ගොඩනගා තිබේ. න්‍යාය හෝ දේශපාලන යනු කිසි විටෙක ස්වායත්ත විචල්‍ය නොවන අතර එහි නෛසර්ගික වශයෙන් ම සමකාලීන යුගයේ හැඩහුරුව, ගතික මෙන් ම එය ඉදිරිපත් කරන්නාගේ පෞද්ගලික අද්දැකීම්වල සංයුක්ත බව ද ගැබ් වී තිබෙයි. ග්‍රාම්ස්චි ම තමා පිළිබඳ දක්වන ආකාරයට ඔහු සංයුක්ත ඓතිහාසික මිනිසෙකි. එබැවින් මෙම ලිපිය පුරා ම ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ සංකල්පය න්‍යායාත්මක ව විශ්ලේෂණය කිරීම සිදු වේ.

## 3. සාකච්ඡාව

### 3.1. ග්‍රාම්ස්චිගේ න්‍යායික ආස්ථානය නිර්මාණය වීමෙහි ලා ඔහුගේ ජීවන ඉතිහාසයෙහි බලපෑම

විසිවන සියවසේ මාක්ස්වාදී න්‍යායට මෙන් ම පොදුවේ දේශපාලනයට සහ පසුකාලීන ශාස්ත්‍රීය ලෝකයට වඩා බලපෑමක් සිදුකරන මේ දේශපාලන ක්‍රියාකාරිකයා, චින්තකයා උපත ලබන්නේ 1891 වසරේ සදිනියාවේ කුඩා නගරයක් වූ ආලිස්හි දී ය (Hoare and Sperber, 2016). භූගෝලීය ස්ථානගතවීම අරභයා සමහර විචාරකයින් හෙතෙම ගොවි සම්භවයක් සහිත අයෙකු ලෙස පෙන්වා දීම සිදුවන නමුත් ඇත්තෙන් ම ඔහුගේ පියා Ciccio Gramsci ප්‍රාදේශීය සිවිල් පාලන තන්ත්‍රයේ රෙජිස්ට්‍රාර්වරයෙකි. ග්‍රාම්ස්චිගේ ළමාවියේ අධ්‍යාපන කටයුතු සම්බන්ධ ව ඔහු දක්වන දක්ෂතා සඳහා පවුල තුළ තිබූ උගත් ආභාසය ද හේතු වූ බව පිළිගැනෙන කරුණකි. 1931 ග්‍රාම්ස්චි විසින් "සිය අක්මුල්" යන හිසින් යුතු ව සිරගෙදර සිට තම නැනා වන ටටියානාට ලියන ලද ලිපියක දක්වන්නේ "මම කිසිවෙකුගේ ජාතියට අයත් නො වේ. මගේ පියා ආසන්න වශයෙන් ඇල්බෙරියන් සම්භවය සහිත අයෙකු වන අතර මගේ මව දෙපාර්ශ්වයෙන් ම සදිනියානුවෙකි" ලෙස යි. එහෙත් ඔහු තවදුරටත් දක්වන්නේ මගේ සංස්කෘතික සැදුම ඉතාලියානු වන අතර මෙය මගේ ලෝකය ලෙස යි (Hoare and Sperber, 2016). ටටියානා සහ ඇයට ලියූ ලිපි නොමැති නම්, ශාස්ත්‍රීය ලෝකයට ග්‍රාම්ස්චි කෙනෙකු නැතිවිය හැකි බව අතිශයෝක්තියක් නොවන්නේ එකී ලිපි හුවමාරුව සහ පසුකාලීන ග්‍රාම්ස්චිගේ ලේඛන සුරක්ෂිත ව මොස්කව් වෙත පිටකිරීමේ භාරදූර කාර්යය මේ සුවිශේෂී කාන්තාව විසින් සිදුකරනු ලබන නිසා ය. මේ ලිපිවල අන්තර්ගතය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී පැහැදිලි වන සුවිශේෂී කරුණක් වන්නේ ග්‍රාම්ස්චි විසින් සිය නැනා සමඟ සිදු කරන ලද ලිපි හුවමාරුව සිය දේශපාලනික ආත්මකථනය සඳහා මාධ්‍යය බවට හෙතෙම පත්කොටගෙන තිබූ බව යි. සම්භවය පිළිබඳ ඔහුගේ ඇදහස් උපුටා ගැනීමෙන් පෙනී යන්නේ ග්‍රාම්ස්චි සිය අනන්‍යතාව සහ ජාතිකත්වය, තමා තුළ ගැබ් ව සිටින සංස්කෘතික මිනිසා පිළිබඳ යම් ආකාර අන්තරාවලෝකනයක නිරත

වන බව යි. ග්‍රාම්ස්චි තුළ පැවති ජාතිකවාදී අදහස් (Fontana, 1993) පිළිබඳ ඉඟියක් ද එමගින් අරුත් ගැන්වෙන බව පැවසිය හැකි ය.

1897 වසර වන විට ග්‍රාම්ස්චිගේ පවුල් පරිසරය වඩා කටුක අද්දැකීම්වලට මුහුණ දීම ආරම්භ වන අතර අයථා ක්‍රියාවකට සැකකරුවෙකු වූ ග්‍රාම්ස්චිගේ පියා රැකියාවෙන් නෙරපීමෙන් පසු ව ආසන්න වශයෙන් වසර හයකට ඔහු සිරගෙට නියම කෙරිණි. සමහර විචාරකයින් දක්වන පරිදි ඔහු රැකියාවෙන් නෙරපීම ප්‍රාදේශීය දේශපාලන බලාධිකාරයේ අත්තනෝමතික තීරණයක් වේ (ගුණසිංග, 2011: Hoare සහ Sperber, 2016). සිය පියාගේ සිරගතවීම ග්‍රාම්ස්චිගේ ජීවිතය කුඩාකල සිට පීඩනයට සහ දුක්ඛිතභාවයට පත්කිරීමට හේතු වන අතර එතැන් පටන් ඔහුගේ මව පවුලේ දරුවන් පස්දෙනෙකු නඩත්තු කිරීමේ කාර්යයට උර දෙන්නී ය. මේ නිසා ම ග්‍රාම්ස්චි සිය මව පිළිබඳ වඩා ගෞරවාදරය සහිත භක්තියක් තිබූ බව ඔහු විසින් ඇයට නිරන්තර ව ලියූ ලිපිවලින් හඳුනා ගත හැකි බව Hoare සහ Sperber (2016) පෙන්වා දෙයි. ග්‍රාම්ස්චිගේ පවුල සහ ඔහු මුහුණ දුන් කටුක ළමා විය දෙයාකාරයකට සලකා බැලිය හැකි ය. එක අන්තයක දරිද්‍රතාව විසින් පීඩාවට පත්කරන ලදු ව අනෙක් අන්තය විසින් කුඩා ග්‍රාම්ස්චිට උරුම කළේ රෝගී ළමා වියකි. කුඩාකල සිට කොඳු ඇට පෙළෙහි පැවති අසාමාන්‍ය වර්ධනය සහ විරූපතාව නිසා ඊට ප්‍රතිකාර ලෙස වෛද්‍යවරුන් විසින් කුඩා ග්‍රාම්ස්චි දවසින් වැඩි ප්‍රමාණයක් තිවසේ බාල්කයේ එල්ලා තැබීමට උපදෙස් ලබා දී තිබිණ. මෙකී භෞතික ව්‍යාකූලතා විසින් මෙම කුඩා දරුවා මානසික, සාමාජීය වශයෙන් ද පසුබට දරුවකු කිරීමට හේතු වූ අතර එම ප්‍රතිකාර විසින් සමකාලීන සාදිනියාවේ පසුගාමීකම ද ප්‍රකට කරන බව ඇතැම් විචාරකයන්ගේ අදහස යි. කෙසේ වුව ද මෙම රෝගී තත්ත්වය විසින් ඔහුගේ ජීවිතය පුරා ම විවිධාකාර බලපෑම් එල්ල කිරීමක් හඳුනා ගත හැකි ය. 1898 පාසල් දිවිය අරඹන මේ කුඩා කොලු ගැටයා එහි දී සිය ශාරීරික ව්‍යාකූලතා හේතුවෙන් ''කුදා/කුදුවා'' යන ලේබල්කරණයන්ට පාත්‍ර වන අතර ම අනෙක් අතින් දරිද්‍රතාව විසින් ප්‍රාථමික පාසල් ගමන අතරමග නවතා දැමීමට ඔහුට සිදුවෙයි (Gundogan, 2008: චාමින්ද, 2019: ගුණසිංහ, 2011: Hoare and Sperber, 2016).

ග්‍රාම්ස්චිගේ පශ්චාත්කාලීන බුද්ධිමය අදහස් මෙන් ම දේශපාලන ක්‍රියාකාරිත්වය ඔහුගේ මෙම කුඩාකල අද්දැකීම්වලින් වියුක්ත ව වටහා ගැනීම සිදුකළ නොහැකි බව මෙහි දී අවධාරණය කළ යුතු ය. සමාජ වෙනස සඳහා වූ නිරන්තර උනන්දුව සහ පවතින සමාජ ක්‍රමය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටිය වර්ධනයෙහි ලා සිය පෞද්ගලික අද්දැකීම් ග්‍රාම්ස්චි වෙත සැලකිය යුතු බලපෑමක් සිදු කළ බව පැවසීම වඩා සාධාරණ ය. මන්ද Hoare සහ Sperber (2016) දක්වන ආකාරයට කුඩාකල බාල්කයේ එල්ලා තැබීමේ දී කිසිදු චෝදනා කිරීමකින් තොර ව එම පීඩාව දරාගනිමින් ද, පසු ව පාසලේ ශිෂ්‍ය ප්‍රජාව වෙතින් උසුළු විසුළු සහ ගල්පහර කමින් ද, සිය සොහොයුරා සමග දරිද්‍රතාව නිසා ම ප්‍රාදේශීය මහනගර සභාවක තමාට වඩා බර ලිපිගොනු ඔසවා වැඩ කිරීමට තිබූ ධෛර්යය විසින් ඔහුගේ ''පැවැත්මේ සාරාර්ථය'' වන අධිෂ්ඨානය සහ දරාගැනීම පිළිබිඹු කෙරේ. වරක් සිය බිරිඳගේ සහෝදරියකට ලියූ ලිපියක හෙතෙම මෙසේ සඳහන් කරයි. ''මගේ ළමා කාලය ගැන කල්පනා කරනවිට මට මතක් වන්නේ එක්තරා ලේඛනාගාරයක් ය. එම ලේඛනාගාරයේ ළමා කම්කරුවෙකු වශයෙන් මා වැඩකරන ලද අතර එහි දී අවුරුදු දහයක පමණ ළමයෙකු වශයෙන් මට බරින් ඉතා වැඩි ලේඛන ගොනු එහා මෙහා ගෙනයාමට සිදුවිය. හැන්දෑවත් ම මගේ ශරීරයේ වේදනා දෙන්නට පටන්ගන්නා අතර මේ නිසා මම සැඟවී වැලපී

ඇත්තෙමි'' (ගුණසිංහ, 2011). මෙසේ දැඩි පීඩා අබිමුව වුව ද නොසැලෙස ධෛර්යය කුඩා කල සිට සිය මරණය දක්වා ම ග්‍රාම්ස්චි වෙතින් පලානොගිය යමක් බව විශද වේ.

ග්‍රාම්ස්චිගේ පෞද්ගලික ජීවිතයෙහි තවත් සන්ධිස්ථානයක් ලෙස 1922 වසරේ ඔහු ෆ්‍ර්මටර්හි පක්ෂ නියෝජිත ලෙස තේරී පත් ව මොස්කව්වලට යෑම දැක්විය හැකි ය. මොස්කව්හි දී ඔහුට පසු කලෙක ඔහුගේ ජීවන සහකාරිය වූ වයලින්වාදිකාවක වන ජූලියා ස්චුච් හමුවෙයි. ඔවුන් දෙපලට දාව පුතුන් දෙදෙනෙකු උපත ලබන අතර පිළිවෙළින් 1924 සහ 1926) ඉන් දෙවෙනි දරුවා සියසින් දැකීමටවත් ග්‍රාම්ස්චිට හැකියාව නොලැබෙන අතර අතකින් එම කාරණය වටහා ගත හැක්කේ ද ග්‍රාම්ස්චිගේ දේශපාලන ජීවිතයෙහි පැවතී අතිශය සංකීර්ණ තත්ත්වයන් සමඟ සසඳමින් ය. මන්ද 1926 ඉතාලියානු ෆැසිස්ට් පාලනය විසින් සිරගත කරන ලද මේ සුවිශේෂී චින්තකයා වසර 11ක් සිරගෙය තුළ ම ගත කරමින් වයස අවුරුදු 46 දී මිය යෑම සිදු වේ (Fontana, 1993: Boothman, 2008). එනිසා සිය දෙවන දරුවා දැකගැනීම පවා ඔහුට අහිමිවන අතර මෙනිසා ම සමස්තයක් ලෙස ඔහුගේ පෞද්ගලික ජීවිතය විසින් ඔහුගේ න්‍යායික ගවේෂණය සහ එහි හැඩය ද ක්‍රියාකාරිත්වය ද අධිනිශ්චය වීම කෙරෙහි පැහැදිලි කාර්යභාරයක් සිදු කොට ඇති බව විද්‍යමාන වෙයි.

### 3.2. ග්‍රාම්ස්චිගේ ශාස්ත්‍රීය අධ්‍යාපන පසුබිම සහ බුද්ධිමය වර්ධනයෙහි වැදගත් අවස්ථා

ඉහත දී ද දක්වන ලද පරිදි කුඩා ග්‍රාම්ස්චි 1898 දී ප්‍රාථමික අධ්‍යාපනය ආරම්භ කළ ද අතරමඟ දී එය කඩාකප්පල් වීම සිදුවෙයි. 1904 පසු ව සිය පියා නැවත සිරගෙයින් නිදහස් ව පැමිණීමෙන් පසු ව මධ්‍යම ප්‍රමාණයෙහි පාසලක් වූ Santu Lussurgia වෙත ඇතුළත් වන ලදු ව එහි දී අධ්‍යාපනික ව සාර්ථක වන හෙතෙම 1908 කල්යාරිහි උසස් ද්විතීයික පාසලට ඇතුළුවීමේ විභාගය සමත්වීමේ හැකියාව ලබා ගනී. මෙම පාසලට ඇතුළත්වීමට සමගාමී ව ඔහු සිය වැඩිමහල් සොහොයුරා වන ජෙන්නාරෝ සමඟ වාසයට යාම සිදු වන අතර එය තරුණ ග්‍රාම්ස්චිගේ දේශපාලන ජීවිතයෙහි හැරවුම් ලක්ෂ්‍යයකි. මෙම වැඩිමහල් සොහොයුරා විසින් ග්‍රාම්ස්චි දේශපාලනික මාර්ගය වෙත අවතීර්ණ කරවීම සිදු කරනු ලබන අතර තම බාල සොහොයුරාට සමාජවාදී පත්‍රිකා ගෙන දීමට හෙතෙම කටයුතු කරන ලදී (Gundogan, 2008: චාමින්ද, 2019). එම පත්‍රිකා කියවීමෙන් ලද ආස්වාදජනක උත්තේජනය විසින් අංකුර චින්තකයා දේශපාලනික ව හැඩගැස්වීමේ කාර්යය සිදුවන්නේ නිරායාසයෙනි. සමකාලීන ඉතාලියානු සමාජය තුළ මතුවෙමින් පැවතී, සාදිනියාව පුරා හමාගිය දේශපාලන කැරැල්ල ද, ඊට හමුදාව වෙතින් ලැබුණු දැඩි මර්දනකාරී පිළිවෙත ද ග්‍රාම්ස්චි වෙත ප්‍රබල බලපෑමක් එල්ල කරන ලදී (Hoare and Sperber, 2016). තරුණ සාදිනියානුවෙකු වූ ග්‍රාම්ස්චි මේ මූලාරම්භක දේශපාලනය තුළ දී සුහුඹුල් දේශපාලනික දැක්මක් දරන අතර මේ වකවානුව වන විට ඔහු තුළ පැවතියේ ප්‍රදේශීයවාදී දේශපාලන චින්තනයකි (Boothman, 2008). හෙතෙම මේ මුල් යුගයේ සාදිනියානු ජාතිකවාදී ව්‍යාපාරය වෙත ආසක්ත වූ නමුත් ඉතා කෙටි කලෙක දී එම ස්ථාවරයෙන් ඔහු වෙනස්වීම හඳුනා ගත හැකි ය. ග්‍රාම්ස්චි තුළ ම සිදු වන මෙම අභ්‍යන්තර විවාදමය ස්වභාවය ඔහුගේ දේශපාලන න්‍යායගත කිරීම් හඳුනා ගැනීමෙහි ලා වැදගත් ය. වරක් ටටියානාට ලියූ ලිපියක ඔහු සඳහන් කරනුයේ ''මගේ සමස්ත බුද්ධිමය විපරිවර්තනය වූයේ විවාදමය ස්වාභාවය යි. අනාසක්ත /පක්ෂයක් නොගත් ස්වභාවය මවිසින් පිළිකුල් කරනු ලබන අතර මට අවශ්‍ය වන්නේ එක්තරා සංවාදකයෙකු, එක් සංයුක්ත පසමිතුරෙකු බව යි'' (Gramsci, 1999). මෙමඟින් විශ්ලේෂණය

කළ හැක්කේ බාහිර දේශපාලනය තුළ මෙන් ම තමා තුළ ම වූ අභ්‍යන්තර චෛතසිකය සමඟ ද ග්‍රාම්ස්චිට යම් ආකාර සංවාදයක් තිබු බව ය. අංකුර අවස්ථාවේ සාදිනියානු ජාතික ව්‍යාපාරය හා මතවාදී ව එකඟ වන සහ ප්‍රදේශීයවාදය සමඟ එකත්පස් ව සිටගන්නා ග්‍රාම්ස්චි ඉතා ඉක්මනින් ටියුරින්හි දේශපාලන අද්දැකීම්වලින් පෝෂණය ලබමින් එම ප්‍රදේශීයවාදී ස්ථාවරය අතික්‍රමණය කිරීම දැකගත හැකි ය. චාමින්ද (2019) පෙන්වා දෙන්නේ කල්යාරිහි ඔහුගේ පාසල්වියේ රචනා අතරින් ඉතිරි ව ඇති අද්විතීය රචනාවකින් ගම්‍ය කරන පරිදි ඔහු ඒ වන විටත් සාදිනියානු මතයන්හි සිට ජාත්‍යන්තරවාදී සහ යටත් විජිත විරෝධී මතයන් දක්වා පරිණාමය වෙමින් පැවති බව යි. ප්‍රායෝගික දේශපාලන, සමාජ අද්දැකීම් සිය විශ්ලේෂණය සමඟ තදනුබද්ධ කිරීමේ සුවිශේෂී ප්‍රභාවක් මේ දේශපාලන චින්තකයා විසින් විදහා දක්වන ලද බව පැවසිය හැකි ය. ඔහු ප්‍රාදේශීය විශේෂතා සහ භූගෝලීය සාධක "ගොවිජන ගැටලු, දකුණේ ප්‍රශ්නය සහ ගොවි හවුල" වැනි සංකල්ප වෙත න්‍යායික ව සූත්‍රගත කරන ලදී. අපෝහක ස්වභාවයෙන් එහි ඇති සංකීර්ණතා විශ්ලේෂණය කිරීම විසින් ග්‍රාම්ස්චිගේ බුද්ධිමය වර්ධනයෙහි වපසරිය පෙන්නුම් කෙරේ. මාක්ස් පිළිබඳ විශ්ලේෂණයක නිරත වන Althusser (1969) මාක්ගේස් ජීවිතයේ බුද්ධිමය වර්ධනය ඔහුගේ සටහන් ආශ්‍රිත ව කොටස් දෙකක් (Young Marx and Old Marx) මඟින් පෙන්වා දෙන අතර ග්‍රාම්ස්චි පිළිබඳ ව ද මෙවැනි විශ්ලේෂණයක් හඳුනා ගත හැකි ය. ග්‍රාම්ස්චිගේ රචනා ආශ්‍රිත ව විශ්ලේෂණයක් සිදු කරමින් Bellomy සහ Schecter (1993) පෙන්වා දෙන ආකාරයට අන්තෝනියෝ ග්‍රාම්ස්චිගේ දේශපාලන සහ බුද්ධිමය ජීවිතය අවධි දෙකකට බෙදා වෙන්කළ හැකි ය.

1. සිරගත වීමට පෙර අවධිය (The pre-prison stage) එනම් 1926 වර්ෂයට පෙර අවධිය
2. සිරගත වීමෙන් පසු අවධිය (In prison stage) එනම් 1926 වර්ෂයට පසු අවධිය (Gundogan, 2008).

ඔවුන් විසින් වැඩිදුරටත් පෙන්වා දෙන්නේ මෙම මුල් අවධිය තුළ ග්‍රාම්ස්චිගේ බුද්ධිමය සහ දේශපාලන ස්ථාවරයන්හි ආධුනිකත්වයක්/අභ්‍යාසලාභීත්වයක් දැකගත හැකි බව ය. එහෙත් ග්‍රාම්ස්චිගේ විශේෂත්වය වන්නේ සිය ආධුනික අද්දැකීම් විසින් උකහාගන්නා ලද දේශපාලනික යථාර්ථ බුද්ධිමය තලයෙහි දේශපාලනික සංවර්ධනය කිරීම සඳහා යෝදා ගැනීමෙහි ලා හෙතෙම දැක්වූ මටසිලිටි ස්වභාවය යි. 1911 ටියුරින් වෙත පැමිණෙන ග්‍රාම්ස්චි, සාදිනියානු දුගී ශිෂ්‍යයින් සඳහා පිරිනැමෙන ශිෂ්‍යත්වයක් ලබා ගනිමින් ටියුරින් විශ්වවිද්‍යාලයට තේරී පත්වෙන නමුත් එහි ජීවිතය ද පෙර දුක්ඛිත තත්ත්වයෙන් වෙනස් වන්නේ නැත. විශ්වවිද්‍යාලය තුළ ග්‍රාම්ස්චිගේ වෛෂයික උනන්දුව වාග්විද්‍යාව, භාෂා ශාස්ත්‍ර වෙත යොමු වුවත් (Mayo, 2015: Ledwith, 2009) ඔහුගේ පරම ලාලසාව වූයේ සක්‍රිය දේශපාලන ක්‍රියාධරයෙකු වීම බව පසක් කරමින් 1915 ඔහු විශ්වවිද්‍යාලය හැරයයි. ඒ ප්‍රායෝගික දේශපාලනය පිළිබඳ ඔහුට තිබූ නොතිත් ආශාව නිසාවෙනි. වර්තමාන ශාස්ත්‍රීය කතිකාව තුළ ග්‍රාම්ස්චියානු සංකල්පගත කිරීම් විසින් වැදගත් ස්ථානයක් ලබාගෙන තිබුණ ද ග්‍රාම්ස්චි අයත් වන්නේ විධිමත් විශ්වවිද්‍යාල අධ්‍යාපනය මඟින් බිහිවූ බුද්ධිමතුන්ගේ කුලකයට නො වේ. ගුණසිංහ (2011) පෙන්වා දෙන පරිදි ග්‍රාම්ස්චි වඩා ආසන්න වන්නේ සිය අද්දැකීම්වලින් බුද්ධිමය ලෝකය ආමන්ත්‍රණය කළ මැක්සිම් ගොර්කිට ය.

ග්‍රාම්ස්චිගේ බුද්ධිමය හැඩගැසීමේ ඉතිහාසය පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ඔහු බුද්ධිමය ලෝකයට සැලකිය යුතු ලෙස අවතීර්ණ වීම සිදුවන්නේ සිය විශ්වවිද්‍යාල සමය තුළ දී ය (Gundogan, 2008). අනෙක් අතින් බොහෝ තරුණ ක්‍රියාධරයින්ට මෙන් ම තරුණ ග්‍රාම්ස්චි වෙත ද 1917 වර්ශයේ (වර්ෂයේ) රුසියානු විප්ලවයේ ආස්වාදජනක රළ පහරෙන් මිදීමට නොහැකි වන අතර සමාජවාදය පිළිබඳ සමකාලීන ඉතාලියානු බුද්ධිමය සංවාදය තුළ වූ උනන්දුව ද ග්‍රාම්ස්චි වෙත බලපෑම් එල්ලකළ බව පැවසීම මනා ය.

ඔහුගේ බුද්ධිමය ජීවිතය සම්බන්ධ ව වැදගත් බලපෑමක් සිදු කළ බෙනඩික්තෝ ක්‍රෝචේගේ බලපෑම ද මේ යුගයේ දැකගත හැකි ය. සිය ශිෂ්‍ය අවධිය පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක නිරතවන Gramsci (1999) වරෙක දක්වන්නේ තමා තුරුණු වියේ දී ප්‍රවණතාත්මක ලෙස ක්‍රෝචියානුවකු ව සිටි බව ය. විශේෂයෙන් ක්‍රෝචේගේ සදාචාර දේශපාලනය (Ethico-Politics) වැනි අදහස් ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ අදහස් කෙරෙහි ප්‍රබල බලපෑමක් සිදු කොට තිබේ. ඔහුගේ මුල්කාලීන ලිපිවල මෙම ආභාෂය පැහැදිලි ව හඳුනා ගත හැකි නමුත් පශ්චාත්කාලීන ඔහුගේ ම අදහස්වල මූලික උනන්දුව යොමු වන්නේ ක්‍රෝචියානු අදහස් පිළිබඳ දෘඪතර විවේචනයක් සඳහා ය (Riley, 2011). ඒ අනුව ග්‍රාම්ස්චි ස්ථානගත කළ හැක්කේ පාර්ශ්වයකින් මාක්ස් සහ ලෙනින්වාදී න්‍යායික ආභාසයද අනෙක් පාර්ශවයෙන් පාර්ශ්වයෙකින් සම්භාව්‍ය ඉතාලියානු දේශපාලන චින්තනයේ ආරම්භකයා වන මකියාවෙල්ලිගෙන් පටන් ගෙන ගයම්බටිස්ටා විකෝ, බෙනඩික්තෝ ක්‍රෝචේගේ න්‍යායික අදහස්වල එක්තරා සම්මිශ්‍රණයක් ලෙස ය (ගුණසිංහ, 2011). ග්‍රාම්ස්චි පිළිබඳ සැලකීමේ දී ඔහුගේ ලේඛන විචාරාත්මක, දෘෂ්ටිවාදී හෝ සරල ව ඓතිහාසික වශයෙන් දැක්විය හැකි නමුදු ග්‍රාම්ස්චි සම්බන්ධයෙන් සලකා බැලීමේ දී ඔහු ස්ථානගත කළ හැකි ප්‍රධාන ආකාර තුනක් හඳුනා ගත හැකි ය. ඉන් පළමු වැන්න වන්නේ ක්රෝශියන් හෝ හෙගේලියානු ග්‍රාම්ස්චි ය. දෙවැන්න ලෙනින්වාදී ග්‍රාම්ස්චි, ජකොබින්වාදී ග්‍රාම්ස්චි හෝ ප්‍රජාතාන්ත්‍රික-ස්වයං සිද්ධතා ග්‍රාම්ස්චි ය. තුන්වැන්න වන්නේ ස්වේච්ඡාමය ග්‍රාම්ස්චි ය.

Hoare and Sperber (2016) දක්වන ආකාරයට ග්‍රාම්ස්චිගේ සංකල්පනා පිළිබඳ සාකච්ඡා කිරීමේ දී අදාළ රචනා ප්‍රධාන ගුරුකුල තුනක අර්ථකථනය කිරීම් මගින් වර්ගීකරණය කෙරෙයි. පළමුවැන්න සම්ප්‍රදායවාදී (ඕර්තඩොක්ස්) හෝ ලෙනින්වාදී ගුරුකුලය යි. එනම් ග්‍රාම්ස්චි යනු ලෙනින්වාදියෙකු ලෙස හඳුනා ගනිමින් ඔහු රුසියානු බෝල්ෂෙවික් අද්දැකීම් ඉතාලියෙහි වෙනස් කොන්දේසි සමඟ ගැළපූවෙකු ලෙස එම ගුරුකුලය ඔහු හඳුනා ගනී. තව ද ග්‍රාම්ස්චි යනු ඉතාලියානු බෝල්ශේවික්වරයෙකු ලෙසත් ලෙනින්වාදී අදහස්වලින් ඉතාලියානු සංස්කෘතිය සහ ඉතිහාසය ගළපමින් න්‍යායාත්මක ව සංවර්ධනය කළ අයෙකු ලෙස මෙම ගුරුකුලය විශ්වාස කරයි. එම ගුරුකුලයට අයත් වන්නේ Togliatti, Spriano, Macciocchi, Buci, Glucksman, Ottino, Anderson, සහ Cammett වැනි අය යි. මෙම අර්ථකථනාත්මක චින්තකයින් අතර දෙවන කණ්ඩායම වන්නේ මූලික ව මාක්ස්වාදී-විරෝධීන් ය. එනම් Nardone, H. S. Hughes සහ Lichtheim යනාදීහු මෙම ගුරුකුලයට අයත් වෙති. ඔවුන් ග්‍රාම්ස්චි දකින්නේ (විශේෂයන් ඔහුගේ හෙජමනිය පිළිබඳ අදහස ලෝකය පිළිබඳ සර්වග්‍රාහී සංකල්පයක් ලෙස) ආකෘතික මාක්ස්වාදී ඒකාධිපති රාජ්‍යයක් පිළිබඳ අදහස පිළිගන්නෙකු ලෙස යි. මෙහි වඩා උනන්දු සහගත කරුණ වන්නේ මෙම ගුරුකුල ද්විත්වය ම ග්‍රාම්ස්චි යනු ලෙනින්වාදියෙකු ලෙස පිළිගැනීම යි. තුන්වන ගුරුකුලය

ස්ථානගත වනුයේ උක්ත සඳහන් කළ ගුරුකුල දෙක අතර තැනක ය. මෙම රචකයින් (එනම් Williams, Matteucci, Garin, Bobbio, Piccone, Davidson and La dtta වැනි අය) ස්ථිර ලෙස ම ප්‍රකාශ කරන්නේ ග්‍රාම්ස්චි විසින් ස්වීය දායකත්වය මාක්ස්වාදී විප්ලවවාදී අදහස් සම්බන්ධයෙන් ලබා දී ඇති අතර ඔවුන් තරයේ ප්‍රතික්ෂේප කරන්නේ ග්‍රාම්ස්චි විසින් ලේනින්වාදයෙහි හුදු ඉතාලියානු ආකෘතියක් නියෝජනය කළ බව යි. පොදුවේ මෙම ගුරුකුල විසින් කරන්නේ ග්‍රාම්ස්චිගේ අදහස්වල එන ඒකාග්‍රත්වයෙහි වැදගත්කම සහ සදාචාර-බුද්ධිමය නායකත්වය (හෙජමනිය) යන්න එක ම අවස්ථාවෙහි අවධාරණය කිරීම ය. කෙසේ නමුත් මාක්ස්වාදී රාමුව තුළ පවතිමින් වුව ද දේශපාලන ක්ෂේත්‍රය පිළිබඳ සහ උපරි ව්‍යුහය පිළිබඳ වැඩි වශයෙන් ආසක්ත වීම කෙරෙහි ග්‍රාම්ස්චිට මෙම බහුවිධ න්‍යායික ධාරාවල අත්‍යන්ත ආලෝකය ලැබී ඇති බව ඒ අනුව විශ්ලේෂණය කළ හැකි ය.

ග්‍රාම්ස්චි පිළිබඳ සාකච්ඡාවෙහි යෙදෙන සෑම ගුරුකුලයක් ම පාහේ ඒකාග්‍රවන එක් මූලික කරුණක් වන්නේ ග්‍රාම්ස්චිගේ බුද්ධිමය සහ දේශපාලනමය චින්තනයෙහි වපසරිය සම්බන්ධයෙන් මකියාවෙලියානු සාකච්ඡාවෙහි අද්විතීය බලපෑම යි (Herrmann, 2017: Fontana, 1993). සාමාන්‍යයෙන් මාක්ස්වාදී ගුරුකුලය තුළ මැකියාවෙලි යනු කෛරාටික කේවට්ටයෙකු වශයෙන් සලකන්නෙකු ලෙස ගුණසිංහ (2011) දක්වයි. එහෙත් එම සම්භාව්‍ය මාක්ස්වාදී රාමුවෙන් ඔබ්බට යමින් මකියාවෙලි සිය න්‍යාය සහ දේශපාලනය සඳහා අදාළ කරගැනීමේ විප්ලවීය න්‍යායික පිම්මක් ග්‍රාම්ස්චි විසින් ගනු ලැබෙයි. මකියාවෙලිගේ කුමාරයා කෘතිය තුළ නූතන පාලකයා පිළිබඳ දක්වන අදහස් ග්‍රාම්ස්චි විසින් සැලකිල්ලට ගනු ලැබෙයි (Fontana, 1993). එහෙත් මාක්ස්වාදී පක්ෂයක තනි පාලකයෙකු නොසිටින නිසාම විප්ලවීය පක්ෂයක ගමන් මඟ කෙරෙහි මකියාවෙලිගේ නූතන පාලකයා පිළිබඳ අදහස් බරපතල අයුරින් සාකච්ඡා කිරීමේ ප්‍රථම ගෞරවය ග්‍රාම්ස්චිට හිමිවෙයි. එනිසා ම ග්‍රාම්ස්චිගේ රචනා තුළ මකියාවෙලිගේ බලපෑම අවසානය දක්වා ම දැකගත හැකි ය.

මේ යුගයේ වෘත්තීය ජනමාධ්‍යවේදියෙකු ලෙස වැඩ ආරම්භ කරන ග්‍රාම්ස්චිගේ දේශපාලන ජීවිතයෙහි සහ බුද්ධිමය කතිකාවෙහි සංවර්ධනය සඳහා එම වෘත්තීය අද්දැකීම් ඉවහල් වන බව නොරහසකි. ඉතාලියානු සමාජවාදී පක්ෂයේ දිනපතා පුවත්පතෙහි ඔහු සේවය ආරම්භ කළ අතර ඔහුගේ සමාජවාදී අදහස්වල සුවිශේෂී වර්ධනයක් ද මෙම යුගයේ ගම්‍යමාන වේ. 1919 වන විට L'ordino Nuovo ඉතාලියානු සමාජවාදී පක්ෂයේ පුවත්පත ආරම්භයට ඔහු සහාය දෙන අතර ම 1920 වන විට ග්‍රාම්ස්චි කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් තනතුරට පත්වෙයි (Gundogan, 2008). බොහෝ ශාස්ත්‍රාලයීය බුද්ධිමතුන්ගෙන් යම් වර්තනීය ස්වාභාවයක් ප්‍රකට කරන ග්‍රාම්ස්චි න්‍යායික තලයේ සංවර්ධනය මෙන් ම ඒ හා සමගාමී ප්‍රායෝගික දේශපාලන ක්‍රියාකාරීත්වය ද විසින් සිහිපත් කරන්නේ Marx සහ Engelsගේ (1888) කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය කෘතියෙහි එන ප්‍රකට කියමනක් වන ''න්‍යාය භාවිතය සඳහා ය'' (Theory - praxis nexus) යන අදහස යි.

තව ද මෙම සමකාලින යුගය පිළිබඳ චිත්‍රය පිරික්සන කල පෙනී යන වැදගත් කරුණක් වන්නේ 1920-21 කාලය තුළ ඉතාලිය පුරා පැතිරුණු කම්කරු පන්තියේ විප්ලවීය සටන් මාලාව ය. එහෙත් රුසියානු ආභාසයෙන් වෙනස් ව යමින් මෙහි දී ගොවීන් විසින් මෙම ''කර්මාන්තශාලා කමිටු ව්‍යාපාරය'' සඳහා සහාය දීම සිදු නො වේ. ඒ වකවානුව තුළ ඉතාලි ෆැසිස්ට්වාදය වර්ධන වීමත් දැකගත හැකි ය. නිර්ධන පන්ති විප්ලවයට බිය වූ සියලු

බහුජන කොටස් සිය ව්‍යාපාරය වෙත ආකර්ෂණය කරගැනීමට බෙනිටෝ මුසලෝනි සමත් වූ අතර පසු ව ඔහු විසින් රාජ්‍ය බලය අල්ලා ගන්න ලදී (ගුණසිංහ, 2011). 1924-1926 කාලය තුළ ග්‍රාම්ස්චි ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂයට නායකත්වය ලබාදෙන අතර එය සුවිශේෂී කාල පරිච්ඡේදයක් වේ. මන්ද එය එක්තරා යුගයක නිමාව සනිටුහන් කරන්නේ එමගින් තනි තනි රටවල විප්ලවය සිදුවීමේ විභවතාව පිළිබඳ අදහස වෙනුවට සාමූහික කොම්ර්ටනය පිළිබඳ අදහස ඉස්මතු වූ නිසා යි (චාමින්ද, 2019). ඔහු 1926 නොවැම්බර් 08 මුසලොනිගේ අත්අඩංගුවට පත්වන අතර ග්‍රාම්ස්චිගේ සිරගත සටහන් ලිවීමේ ආරම්භය වන්නේ මෙය යි. එම ආරම්භක කටු සටහන් වෙතින් ඉතාලියානු ඉතිහාසය, දේශපාලනය, බුද්ධිමතුන්, දාර්ශනිකයින්, කලාව, සාහිත්‍යය සහ සංස්කෘතික ප්‍රශ්න වැනි විශාල පරාසයක් ආවරණය වීම සිදු වේ (Gundogan, 2008). එමගින් පෙන්වා දෙන්නේ ආර්ථික නියතිවාදය පිළිබඳ දෘඪතර විග්‍රහයෙන් වෙනස් ව සංයුක්ත සහ වඩා පුළුල් මාක්ස්වාදී දෘෂ්ටියක් ගොඩනැගීමෙහි ලා ග්‍රාම්ස්චි සතුවූ විභවතාව යි. දෙවන ලෝක යුද්ධයෙන් පසු ව "සිරගත සටහන්" (Prison Notebook) නමින් ප්‍රකාශයට පත්වන්නේ ග්‍රාම්ස්චි විසින් 1926 සිරගත වීමෙන් පසු ව ලියූ මෙම සටහන් ය. ග්‍රාම්ස්චියානු න්‍යායගතකරණයේ වඩා සංවර්ධිත සහ පරිණත අවස්ථාව ප්‍රදර්ශනය කරන්නේ සිරගත සටහන් තුළිනි. ග්‍රාම්ස්චිගේ ලිපිලේඛන පරික්ෂා කරන බොහෝ විචාරකයින් අතර මාක්ස්වාදය පිළිබඳ ඔහුගේ විවේචනය ඔස්සේ විප්ලවවාදී දේශපාලනය විසංයෝජනයට හෙතෙම දරනු ලබන උත්සාහය සහ දෙවන ජාත්‍යන්තරයට ග්‍රාම්ස්චි විසින් එල්ල කරනු ලබන විවේචන හා ඊට පසුබිම් වූ ඓතිහාසික, න්‍යායික හා දේශපාලන කොන්දේසි අවබෝධ කරගැනීමේ උත්සාහයක් දැකගත හැකි ය (Fontana, 1993). එසේ ම තවදුරටත් අනෙකුත් දේශපාලන චින්තකයින් හා සසඳන කල ග්‍රාම්ස්චිගේ චින්තනය හා දේශපාලනය, ඔහුගේ රචනා පශ්චාත් යුද කාල සීමාවේ ඉතාලියානු කොමියුනිස්ට් පක්ෂයේ දේශපාලනය වටහා ගැනීමේ මූලාශ්‍රයයක් ලෙස ද න්‍යායාත්මක ව සාධාරණීකරණය කළ හැකි අතර දෘෂ්ටිවාදී ම ව ද සුජාත කළ හැකි බව Fontana (1993) තවදුරටත් දක්වයි.

ග්‍රාම්ස්චිගේ දේශපාලන සහ බුද්ධිමය ජීවිතයෙහි වැදගත්කම පිළිබඳ අවධානය යොමු කිරීමේ දී ග්‍රාම්ස්චි සිරගත කරන අවස්ථාවේ ඔහු විනිශ්චය කළ පැසිස්ට් විනිශ්චයකරු පැවසූ පහත අදහසින් ඒ සම්බන්ධ ව වටහා ගත හැකි ය. "අඩු වශයෙන් අවුරුදු විස්සකට මෙම මොළයේ ක්‍රියාකාරීත්වය නැවැත්විය යුතු ය" (ගුණසිංහ, 2011). එහෙත් සිරගත කරන ලද ග්‍රාම්ස්චිගේ මොළයේ ක්‍රියාකාරීත්වය මේ සියවස දක්වා ම බලපෑම් සහගතවීම වැලැක්විමෙහි ලා කිසිවෙකුත් සමත්වූයේ නැත. 1937 වසරේ අප්‍රේල් මස සිරගෙයින් නිදහස්වන ග්‍රාම්ස්චි එම වසරේ ම මරණයට පත්වන්නේ කුඩාකල සිට ම ඔහු මුහුණ දුන් සෞඛ්‍ය සංකූලතා උත්සන්න වීමෙනි. එහෙත් ඔහුගේ මරණයෙන් බොහෝ කලකට පසු ව වුව ද ඔහුගේ අදහස්වල මතවාදීමය සහ බුද්ධිමය බලපෑම වඩා ප්‍රබල වී ඇති අතර හෙජමනිය හෙවත් ආධිපත්‍යය යනු සිරගත සටහන් තුළ ඔහු විසින් හඳුන්වාදෙන එක් සුවිශේෂී සංකල්පයකි. මේ අනුව ඉහත සාකච්ඡා කළ පරිදි ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ සංකල්පය වටහා ගත යුත්තේ යථෝක්ත සාකච්ඡාව තුළ හඳුනාගත් සංයුක්ත චිත්‍රය තුළ පිහිටමින් ය. සමාජයේ බහුතර ජනයා වූ ගොවි ප්‍රජාව විසින් කම්කරු සටන් සඳහා සහාය නොදීම, ඉතා දැඩි ලෙස වර්ධනය වෙමින් පැවති ෆැසිස්ට්වාදය, සම්භාව්‍ය මාක්ස්වාදයේ වලංගුභාවය පිළිබඳ ප්‍රායෝගික වශයෙන් ඇති වූ පරස්පරතා සහ තමා නියෝජනය කළ

කොමියුනිස්ට් පක්ෂය සමඟ ඔහුට තිබූ මතවාදීමය නොඑකඟතා විසින් ග්‍රාම්ස්චිගේ න්‍යායික අදහස් වර්ධනය කොට තිබෙන බව පැහැදිලි ය.

### 3.3. ග්‍රාම්ස්චියානු මතවාද ශාස්ත්‍රීය පරිධිය තුළ සිතියම්ගතකරණය

මෙම තේමාව ඔස්සේ ශාස්ත්‍රීය වශයෙන් ග්‍රාම්ස්චියානු අදහස් පිළිබඳ දළ සිතියමක් නිර්මාණය කරගැනීමට උත්සාහ කරයි. ග්‍රාම්ස්චි ස්ථානගත වන්නේ මාක්ස්වාදී න්‍යායධරයෙකු ලෙස නමුත් ඔහු අයත් වන්නේ සම්භාව්‍ය මාක්ස්වාදය වෙත විවේචනාත්මක සභායක් දක්වන නව මාක්ස්වාදී ගුරුකුලය සමඟ යි. සම්භාව්‍ය මාක්ස්වාදය තුළ වැඩකරන පන්තිය විශ්වීය සංකල්පයක් ලෙස හඳුනා ගනිමින් ඔවුන්ට විමුක්තිය අත්කරගැනීම සඳහා ධනවාදයට විරුද්ධවීම යන සාම්ප්‍රදායික මාක්ස්වාදී මතයට පශ්චාත් මාක්ස්වාදීහු විවේචන එල්ල කරති. Lves (2004) පෙන්වා දෙන්නේ ග්‍රාම්ස්චියානු බුද්ධිමය දායාදය බටහිර මාක්ස්වාදය වර්ධනය කෙරෙහි පළමු සහ අතිශය තීරණාත්මක බලපෑමක් සිදුකළ බව යි. මාක්ස්වාදී සම්ප්‍රදාය තුළ සංස්කෘතිය පිළිබඳ ප්‍රශ්නය වඩා තියුණු ලෙස මතු කිරීම යථාර්ථයක් කළ ලේඛකයා වන්නේ ග්‍රාම්ස්චි ය. ග්‍රාම්ස්චිගේ අදහස් මුඛ්‍ය කරුණු ලෙස සෙසු මාක්ස්වාදී රචකයින් භාවිත කළ අතර ඔහුගේ හෙජමනිය පිළිබඳ සංකල්පය නව මූලධර්මයක් ස්ථාපනය කරයි. පශ්චාත් මාක්ස්වාදයෙහි මූලික තේමාවක් වන්නේ පන්තිය සහ දේශපාලනය අතර පවතින සබඳතාව ප්‍රශ්න කිරීම යි (Herrmann, 2017: Hoare සහ Sperber, 2016). එක් අතකින් ග්‍රාම්ස්චි නව මාක්ස්වාදී ගුරුකුලයට අදාළ ව සලකා බැලෙන්නේ මෙම අදහස් මගිනි. ආර්ථික සාධකයෙහි වැදගත්කම අවධාරණය කරමින් වුව ද අනෙකුත් දේශපාලන සහ උපරි-ව්‍යුහීය කාරණා වෙත සැලකිය යුතු අවධානයක් ග්‍රාම්ස්චි ලබා දී තිබේ. මෙම හේතුව නිසා ම මාක්ස්වාදී න්‍යාය සඳහා සංස්කෘතික මානයක් එකතු කිරීමක් ග්‍රාම්ස්චි විසින් සිදුකෙරුණු බව Lves (2004) මෙන් ම Ledwith (2009) පෙන්වා දෙයි.

එසේ වුව ද ඔහුගේ සිරගත සටහන් තුළ ග්‍රාම්ස්චි ඉතා ම ආකෘතිගත ආකාරයට මාක්ස්වාදී පාරිභාෂික වන "පන්තිය", "කම්කරු පන්තිය" වැනි පද භාවිත නොකිරීමට වග බලා ගනී. (මන්ද ඔහුගේ ලියවිලි ෆැසිස්ට් පරීක්ෂකයින් කියවන ලදී) ග්‍රාම්ස්චිගේ ලියවිලිවල "අධිපති පන්තිය" ධනේශ්වර කොටස වන අතර ඔවුන් හැඳින්වීම සඳහා Bourgeoisie යන පදය භාවිත කෙරේ. ඉන් අදහස් වන්නේ සමාජ නිෂ්පාදනයෙහි අයිතිකරුවන් ය. නිත්‍ය වැටුප් ලබන සේවකයින් සේ ම කේන්ද්‍රීය නිර්-ප්‍රභූ කොටස කම්කරුවන් හෙවත් Proletariat වන නමුත් පොදුවේ ඊට අනෙක් නිර්-ප්‍රභූ කොටස් ද අයත් වෙති (Boothman, 2008).

අනෙක් අතින් සමාජ විද්‍යාව සහ පොදුවේ සමාජීය විද්‍යා තුළ සාකච්ඡාවට බඳුන්වන ව්‍යුහවාදය පිළිබඳ අදහස් ආශ්‍රයෙන් ග්‍රාම්ස්චි ව්‍යුහවාදියෙකු ය යන මතය ද ඔහු ස්ථානගතකරන එක් අක්ෂයකි. චාමින්ද (2019) තර්ක කරනුයේ ග්‍රාම්ස්චිගේ න්‍යායික සංකල්ප හුදෙකලා කොට ගනිමින් ඔහු සංස්කෘතික න්‍යායවේදියෙකු, නිර්-ප්‍රභූ ඉතිහාසය පිළිබඳ න්‍යායවේදියෙකු හෝ සමාජ උපරි ව්‍යුහයන් පිළිබඳ න්‍යායවේදියෙකු ලෙසින් අර්ථකථනය කරන ප්‍රවේශයට වඩා ග්‍රාම්ස්චි කොමියුනිස්ට් ක්‍රියාකාරිකයෙකු, න්‍යායධරයකු සහ චින්තකයෙකු ලෙස හඳුනා ගත හැකි බව යි. කෙසේ වුව ද මෙම සංයුක්ත තත්ත්වය සලකමින් Hoare සහ Sperber (2016) පෙන්වා දෙන්නේ අධ්‍යාපනය, ජනමාධ්‍ය වැනි

ක්ෂේත්‍ර විශ්ලේෂණයට මෙන් ම පොදුවේ ධනවාදය පිළිබඳ න්‍යායාත්මක විශ්ලේෂණය සිදු කිරීම සඳහා ඉවහල්වන විශ්ලේෂකයෙකු ලෙස මෙන් ම ක්‍රියාකාරී දේශපාලන ජීවියෙකු ලෙස ද ග්‍රාම්ස්චි හඳුනා ගත හැකි බව යි. අනෙක් අතින් Lves (2004) පෙන්වා දෙන්නේ භාෂාව පිළිබඳ සහ වාග්විද්‍යාව පිළිබඳ වටහා ගැනීමේ දී ඉතා අගනා න්‍යායික සහයක් (සහායක්) ග්‍රාම්ස්චි වෙතින් පිරිනැමෙන බව ය. එනම් භාෂා භාවිතය සහ අධිපති දෘෂ්ටිවාද විසින් භාෂාව භාවිතය හරහා ගොඩනගනු ලබන බලය මෙන් ම සමාජ නිර්-ප්‍රභූ කොටස් කෙරෙහි භාෂාමය හෙජමනිය ක්‍රියාකරනු ලබන ආකාරය වටහා ගැනීම කෙරෙහි මෙම සංකල්ප වඩා වැදගත් වේ. Ledwith (2009) මෙන් ම Budgeon (2014) පෙන්වා දෙන ආකාරයට බටහිර මාක්ස්වාදී බුද්ධිමය ධාරාව පෝෂණය කිරීම සම්බන්ධයෙන් මෙන් ම ස්ත්‍රී-පුරුෂ සමජභාවීය අධ්‍යයන පිළිබඳ අවධානය යොමුකිරීමේ දී යොදාගත හැකි සංකල්පීමය යතුරක් ලෙස ද ග්‍රාම්ස්චිගේ න්‍යායගත කිරීම් වැදගත්කමක් උසුලයි. Ledwith (2009) වැඩිදුරටත් දක්වන්නේ ස්ත්‍රීවාදී බුද්ධිමය විවාදය සඳහා ග්‍රාම්ස්චිගේ න්‍යායගත කිරීම් වෙතින් ලැබුණු දායකත්වය වෙනුවෙන් ඔහුට ස්තුතිවන්ත විය යුතු බව ය. සත්‍ය වශයෙන් ම සම්භාව්‍ය මාක්ස්වාදී ඉගැන්වීම් තුළ පොදුවේ කම්කරු පන්තිය හෝ ශ්‍රමිකයා පිළිබඳ දේශපාලනික, ආර්ථික අර්ථයෙන් සිදුවන විග්‍රහය විසින් එම කොටස් තුළ සිටින ස්ත්‍රිය සහ ස්ත්‍රී-පුරුෂ සමජභාවීය අසමානතා පිළිබඳ අවධානයක් ලබා නො දෙයි. එම නිසා ම අදාළ විග්‍රහයන් විසින් සමාජයේ බලය යන්න විවිධ ස්ථර (ස්තර) අතර ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ වටහා ගැනීම සම්බන්ධයෙන් ලබා දෙනුයේ අසම්පුර්ණ (අසම්පූර්ණ) න්‍යායික සහායකි. එම තත්වය සමතික්‍රමණය කරන ග්‍රාම්ස්චි කම්කරු පන්තිය, ගොවි ජනතාව මෙන් ම එම ජනතාව අතර සිටින නිර්-ප්‍රභූ කොටසක් වන ස්ත්‍රිය කෙරෙහි සහ ඇයගේ සමාජ ලෝකය සහ බලය කෙරෙහි බලපාන කොන්දේසි පිළිබඳ වටහා ගැනීමෙහි ලා වඩා පෘථුල මඟ පෙන්වීමක් ලබා දෙනබව පැවසිය හැකි ය. Hoare සහ Sperber (2016) තර්ක කරන පරිදි ග්‍රාම්ස්චි ''පශ්චාත්-මාක්ස්වාදය'' පිළිබඳ විවාදවල ප්‍රධාන චරිතයක් බවට පත් ව ඇති සේ ම සමාජය සහ දේශපාලනය පිළිබඳ මාක්ස්වාදී ආකෘතිය යල්පැන ගිය එකක් වීම සහ එය නැවත ප්‍රතිස්ථාපනය කිරීමේ අවශ්‍යතාව ඔහු විසින් මතු කෙරිණි. පශ්චාත් මාක්ස්වාදය විසින් මතුකරන ලද මුඛ්‍ය දේශපාලන කරුණක් වූයේ නව සමාජ ව්‍යාපාරවල ''අභියෝගයන්'' ය. Riley (2011) ද මෙම අදහසට එකඟ වේ. එනම් කාන්තා අයිතිවාසිකම් පිළිබඳ වූ අරගලය, සමලිංගික අයිතිවාසිකම්, සාමය සහ විසිවන සියවසේ අවසන් දශකවල පරාසයන් මේ අතර වෙයි. Lears (1985) දක්වන ආකාරයට ඇමරිකානු ඉතිහාසය යළි අර්ථකථනය කිරීම සඳහා ග්‍රාම්ස්චි විසින් ආරම්භක ලක්ෂයක් සැපයෙයි. Dunn et al. (1994) පෙන්වා දෙන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය වැනි සංකල්ප ඔස්සේ රාජ්‍යය මෙන් ම අන්තර් රාජ්‍ය සැකැස්ම පිළිබඳ කාරණා වටහා ගැනීමෙහි ලා වැදගත් දායකත්වයක් සපයන බව යි. මෙම සියලු අදහස් සමෝධානය කොට සැලකීමේ දී පෙනී යන එක් විශ්ලේෂණීය කරුණක් වන්නේ න්‍යායික සහ ප්‍රායෝගික බුද්ධිමය දායකත්වයෙහි ග්‍රාම්ස්චිගේ මැදිහත්වීම සහ ස්ථානගත වීම හඳුනාගත හැක්කේ වඩා පුළුල් ආකාරයෙන් බව ය.

Hoare සහ Sperberට (2016) අනුව ග්‍රාම්ස්චිගේ බලපෑම ශාස්ත්‍රීය ලෝකය කෙරෙහි ප්‍රධාන ආකාර කිහිපයකින් බලපෑම් කොට තිබේ. එම අදහස් සම්පිණ්ඩනය කොට අදාළ බලපෑම ප්‍රවර්ගගත කළ හැකි ය.

1. එතෙක් සම්භාව්‍ය මාක්ස්වාදී අධ්‍යයනවල එතරම් අභිරුචියකින් වර්ධනය නොවූ ස්ත්‍රිය පිළිබඳ ගැටලු සහ ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අධ්‍යයන වෙත ඉන් විශාල මඟ පෙන්වීමක් සිදු කොට තිබේ.
2. එඩ්වඩ් සයිඩ්ගෙන් ආරම්භ වන පශ්චාත් යටත් විජිත අධ්‍යයන සඳහා ෆූකෝගේ බලපෑම මෙන් ම ග්‍රාම්ස්චිගේ හෙජමනිය සහ දෘෂ්ටිවාදය පිළිබඳ අදහස් ද වැදගත් බලපෑමක් සිදු කොට තිබේ.
3. සයිඩ්ගේ පශ්චාත් යටත්විජිත අධ්‍යයනවල ආභාසයෙන් ගොඩනැගෙන නිර්-ප්‍රභූ අධ්‍යයන කෙරෙහි ද ග්‍රාම්ස්චියානු බලපෑම බහුල ව හඳුනා ගත හැකි ය.
4. සංස්කෘතික අධ්‍යයන පිළිබඳ ශාස්ත්‍රීය වපසරිය පුළුල් වීම කෙරෙහි ග්‍රාම්ස්චිගේ අදහස්වල පැහැදිලි බලපෑමක් හඳුනාගත හැකි ය. සමහර විචාරකයින් ග්‍රාම්ස්චි සංස්කෘතික අධ්‍යයන පිළිබඳ න්‍යායධරයෙකු ලෙස හඳුනාගන්නේ මෙම කාරණය නිසා ය.
5. මාධ්‍ය සහ ප්‍රභූ අධ්‍යයන සම්බන්ධ ශාස්ත්‍රීය ලෝකය කෙරෙහි ද ග්‍රාම්ස්චියානු බලපෑම හඳුනා ගත හැකි ය.

මෙම කාරණා සලකා බැලීමේ දී පැහැදිලි ව පෙනීයන්නේ ග්‍රාම්ස්චිගේ අදහස්වල බලපෑම ක්ෂේත්‍ර ගණනාවකට ඇති බව ය. එහෙයින් ග්‍රාම්ස්චි අයත් වන්නේ ඉන් කුමන අංශයට ද යන්න සෙවීම තරමක් අගතිගාමී විය හැකි බව ය. කෙසේ වුව ද ඉතාලියානු ඓතිහාසික සමාජ දේශපාලන ගැටලු, ධනවාදය සහ ෆැසිස්ට්වාදයෙහි වර්ධනයට සාපේක්ෂ ව ඔහු විසින් සිය අදහස් ඉරිදිපත් කළ නමුත් වර්තමාන ශාස්ත්‍රීය කතිකාව වෙත එම රචනාවලින් විශාල අනාගත බලපෑමක් ඇති කොට ඇති බව වඩා සාධාරණ ව පැවසිය හැකි ය. එම නිසා ම ග්‍රාම්ස්චියානු මැදිහත්වීම ශාස්ත්‍රීය පරිධිය තුළ අක්ෂ කිහිපයක් තුළ පිහිටමින් සිතියම්ගතකරණය එම අදහස් පිළිබඳ වඩා සාධාරණ, පුළුල් චිත්‍රයක් ලබා දෙයි. එම තත්ත්වය තුළ හිඳිමින් මීළඟට මෙම ලිපියෙහි වඩා වැදගත් කොටසට යොමු වීම සිදුවෙයි. මෙහි දී හෙජමනිය හෙවත් ආධිපත්‍යය යන සංකල්පය පිළිබඳ වටහා ගැනීමට උනන්දුව යොමු වෙයි.

### 3.4. හෙජමනිය යන සංකල්පය පිළිබඳ හඳුනා ගැනීම

ග්‍රාම්ස්චිගේ සමස්ත අදහස්වල ඉතා ම වැදගත් එමෙන් ම කේන්ද්‍රීය සංකල්පයක් ලෙස හෙජමනිය (සිංහල භාෂාවේ ජෙමනියට අදාළ වචනය ලෙස ආධිපත්‍යය හෝ අධිකාරිත්වය ලෙස භාවිත කෙරුණ ද හෙජමනිය යන්නෙහි නියම අදහස ඉන් ගම්‍ය නොවන බවක් හැඟෙන හෙයින් ලිපිය තුළ හෙජමනිය යන යෙදුම ම භාවිත කෙරේ. 1926 වසරෙන් පසු බටහිර තුළ කුමන ආකාරයේ හෝ සමාජවාදී විප්ලව සිදුවීම ව්‍යර්ථ වීම, ධනවාදය විසින් පශ්චාත් යුද ආර්ථිකය තුළ පවා සිය පැවැත්ම නොනැසී පවත්වාගෙන යාම සහ තහවුරු කිරීම, පාර්ලිමේන්තු රෙජීමය දැඩි ලෙස පැවතීම හෝ කතිපයාධිකාරිත්වය වෙතින් ප්‍රතිස්ථාපනය වීම යන යථාර්ථය තුළ ස්ථානගත වීමට ග්‍රාම්ස්චිට සිදු විය. මෙම කොන්දේසි 1917-1921 කාලයේ සමාජවාදී විප්ලවයක් සිදුවීමේ ශක්‍යතාවට වඩා ඉඳුරා ම සංකීර්ණ විය. එම සමකාලීන සමාජ දේහය සහ එහි කොන්දේසිවල සැකැස්ම විසින් ධනවාදී සමාජයෙහි දේශපාලන සහ දෘෂ්ටිවාදී මූලාශ්‍රය පිළිබඳ නව්‍ය විශ්ලේෂණයක් ඉල්ලා සිටින ලදී. විශේෂයෙන් ම මෙම අපේක්ෂිත විශ්ලේෂණය විසින් ධනවාදයෙහි ඇති විශිෂ්ට වූ ප්‍රත්‍යස්ථතාව විෂයයෙහි සමකාලීන වටහා ගැනීමක් සිදු කළ යුතු ද විය. අනෙක් අතින්

මෙම සමකාලීන කොන්දේසි වෙතින් නව උපායමාර්ග ඉල්ලා සිටි අතර ඒවා 1917 වර්ෂයෙහි රුසියාව තුළ ක්‍රියාත්මක වූ උපායමාර්ගික සැලසුම්වලට වඩා වෙනස් වීමේ අවශ්‍යතාවක් තිබිණ (Gramsci, 2000). මේ නිසා හෙජමනිය යන සංකල්පය මතුවන්නේ එම පසුබිමට අදාළ ව බව පැහැදිලි වන කරුණකි.

හෙජමනිය පිළිබඳ වටහා ගැනීමේ දී ගුණසිංහ (2011) මෙන් ම Fontana (1993) දක්වන ආකාරයට මකියාවෙලිගේ දේශපාලන චින්තනය ආශ්‍රයෙන් ග්‍රාම්ස්චි විසින් සංකල්පනය කරන පාලන මාධ්‍ය දෙකක් තිබේ. මෙම පාලන මාධ්‍ය දෙක වන්නේ ආධිපත්‍යය සහ මර්දන තන්ත්‍රය යන්න යි. නායකත්වය පිහිටුවීම යන්න කිසිදු සමාජයක මර්දනයෙන් පමණක් කළ නොහැකි දෙයක් වන අතර මතවාදීමය ආකාරයෙන් විවිධ පන්ති, සමාජ ස්තර හා ශ්‍රේණි තම මතයට එකඟකර ගැනීම ද මෙහි දී අත්‍යවශයෙන් ම සිදුවිය යුත්තකි. ඇතැම් රාජ්‍යවල මර්දනය සුළු ප්‍රමාණයෙන් සහ මතවාදීමය එකඟතාව විශාල ප්‍රමාණයෙන් පවතින අතර එවැනි පාලන තන්ත්‍රයක් හෙජමනිය යොදාගැනීමේ අවස්ථාවක් ලෙස ග්‍රාම්ස්චි දක්වයි.

Gramsci ට (1999) අනුව හෙජමනිය යනු සරල අර්ථයෙන් කොන්දේසින් එනම් හෙජමනික පද්ධතියක් තුළ මූලධාර්මික පන්තීන් විසින් ක්‍රියාවෙහි යොද වන නායකත්වයෙහි දේශපාලන, බුද්ධිමය සහ සදාචාර භූමිකාවන් වන අතර ඒවා සංයුක්ත වනුයේ පොදු "ලෝක-දැක්මක්" හෝ ඓන්ද්‍රීය-දෘෂ්ටිවාදයකින් ය (Gramsci, 2000). Allman (1999, 2010) උපුටමින් Mayo (2015) දක්වන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ සංකල්පය මාක්ස්ගේ (සහ එංගල්ස්) සවිඥානිකත්වය පිළිබඳ න්‍යාය සමඟ අතිශයින් තදනුබද්ධ (තදනුබද්ධ) බව ය. "පාලක අදහස්" යනු වෙනත් කිසිවක් නොව අධිපති භෞතික සම්බන්ධතාවල පරමාදර්ශී අපේක්ෂාවන් ය. මෙකී අධිපති භෞතික සම්බන්ධතා ග්‍රහණය කොට ගන්නේ අදහස් ලෙස ය. මෙමඟින් අදාළ සම්බන්ධතා විසින් එක් පන්තියක් පාලක පන්තිය ලෙස නිර්මාණය කරන අතර එම අදහස් එහි ම අධිපතිත්වය බවට පත් වන බව පෙනේ. Forgacs (2000) දක්වන ආකාරයට සරල අරුතින් හෙජමනිය යන්නෙන් හැඳින්වෙන්නේ කැමැත්ත මඟින් කෙරෙන පාලනය යි. හෙජමනිය තුළ දී ග්‍රාම්ස්චි සිය අවධානය දේශපාලන බලය භාවිතයෙහි සංස්කෘතික සහ සදාචාර පැතිමාන වෙත යොමු කරයි (Hoare සහ Sperber, 2016; Riley, 2011). මේ නිසා හෙජමනිය තුළ වූ එකඟත්වයෙහි සහ මර්දනයෙහි අපෝහකයේ මාධ්‍යය පිළිබඳ ග්‍රාම්ස්චියානු අවබෝධය මකියාවෙලිගේ රචනාවල ආභාසයක් සලකුණු කරයි. කුමාරයා කෘතියේ (1532) අපට "නාරාශ්වයෙකුගේ" රූපය සොයා ගත හැකි ය. එය අර්ධ තිරිසන් සහ අර්ධ මනුෂ්‍ය වේ. මෙමඟින් අර්ධ බලහත්කාරය සහ අර්ධ බුද්ධියෙහි අපෝහක දේශපාලනයෙහි රූපකයක් ලෙස හඳුනා ගත හැකි ය (Boothman, 2008). එසේ ම මෙම අපෝහක සම්බන්ධතාව පිළිබඳ අදහස් දක්වන Gundogan (2008) පෙන්වා දෙන්නේ ග්‍රාම්ස්චි කෙරෙහි හෙගලියානු අභාසය හෙජමනිය පිළිබඳ අපෝහක සම්බන්ධතා ආශ්‍රයෙන් හඳුනාගත හැකි බව ය. එනම් හෙජමනිය යන්න ක්‍රියාත්මක වන්නේ බලහත්කාරය සහ එකඟතාව යන අපෝහක පැවැත්ම මත ය. පොදුවේ මකියාවෙලියානු අපෝහක සබඳතාව මෙන් ම අනෙක් අතින් මාක්ස්වාදය තුළ හෙගලියානු අපෝහක සබඳතාව ද යන ද්විත්ව ආභාසය ම ග්‍රාම්ස්චිගේ මෙම හෙජමනික වටහා ගැනීමේ තාර්කික අන්තය කෙරෙහි බලපෑම්සහගත වූ බව මේ නිසා විශ්ලේෂණය කළ හැකි ය.

හෙජමනිය සම්බන්ධ ව ග්‍රාම්ස්චිගේ අදහස්වල මූලය පිළිබඳ සලකා බැලීමේ දී Dunn et al. (1994) පෙන්වා දෙන ආකාරයට ඉතාලිය තුළ ෆැසිස්ට්වාදයෙහි වර්ධනය මෙන් ම ඉතාලියානු ධනපති පන්තිය අසාර්ථක වීම අරභයා "ආධිපත්‍ය" පිළිබඳ වටහා ගැනීමට සහ ඒ පිළිබඳ අදහස් දැක්වීමට ග්‍රාම්ස්චි උනන්දු වෙයි. එහෙත් ග්‍රාම්ස්චිට පෙර හෙජමනිය යන පදය ඉතිහාසයෙහි විවිධ අයුරින් භාවිත වී ඇති අතර ඒ පිළිබඳව ද වටහා ගැනීම ද වැදගත් ය. හෙජමනිය යන සංකල්පය පුරාණ ග්‍රීසියේ පාලකයින් - පාලිතයින් අතර සබඳතා විස්තර කිරීමේ දී සහ රාජ්‍යයන් අතර සබදතා විස්තර කිරීමේ දී ද හඳුනාගත හැකි බව ග්‍රාම්ස්චි දක්වයි (Boothman, 2008: Herrmann, 2017). පුරාණ ග්‍රීසියේ හෙජමනිය යන පදය eghestai යන පදයෙන් බිඳී එන අතර එහි අර්ථය වන්නේ "අණ කිරීමට හෝ පාලනය කිරීමට" යන්න යි. මෙම පදය ඉන් පෙර උපත ලබන්නේ eghemon යන්නෙන් වන අතර පෙලපොනේසියන් යුද්ධ කාල සීමාවේ දී ග්‍රීක නගර-රාජ්‍ය සන්ධානය තුළ නගරයක් නායකත්ව තනතුරකට නියම කිරීම පිළිබඳ හැඳින්වීම සඳහා මෙම පදය භාවිත කරන ලදී. ජාත්‍යන්තර සම්බන්ධතා ශික්ෂණය තුළ "හෙජමනිය" යන පදය තවමත් මෙම පුරාණ අර්ථයෙන් ඍජු ව ලබාගත් ඇඟවුම ඔස්සේ භාවිත කරනු ලැබේ. එනම් එක් තනි රාජ්‍යයක් මිලිටරි, ආර්ථික, සහ රාජ්‍යතාන්ත්‍රික උපායන් සම්බන්ධයෙන් ආධිපත්‍යය දැරීමේ නිමේෂයක් හැඳින්වීම සඳහා යි (Hoare සහ Sperber, 2016).

හෙජමනිය යන පදය සම්බන්ධ ව පවතින මෙම පුරාණ ග්‍රීක භාවිතයෙන් පසු එම පදය භාවිත කරන්නේ මාක්ස්වාදීන් ය. මාක්ස්වාදී චින්තන සම්ප්‍රදාය තුළ "නායකත්වය" යන අරුතින් හෙජමනිය යන සංකල්පය මුලින් ම භාවිත කළේ ප්ලේකනෝව්, අක්සල්රෝඩ් සහ වී. අයි. ලෙනින් ඇතුළු රුසියානු සමාජ-ප්‍රජාතන්නත්‍රවාදී කම්කරු පක්ෂයේ න්‍යායවේදීන් ය. (චාමින්ද, 2019). ට්‍රොස්කි විසින් හෙජමනිය යන්න විශාල සංදර්භ ගණනාවක භාවිත කළ අතර එක අතකින් එම වචනයෙහි මුල් ග්‍රීක අර්ථයෙන් මිලිටරි නායකත්වය යන පාර්ශ්වයෙහි සිට මෙන් ම ග්‍රාමස්චිගේ අරුතින් හෙජමනික භූමිකාවෙහි භාවිතමය අර්ථය වටහා ගැනීම යන අදහසින් ද ඔහු මෙම වචනය භාවිත කරන ලදී. ඒ සඳහා ඔහු intelligentsia යන පදය භාවිත කරයි (Dunn et al., 1994: Boothman, 2008). ග්‍රාම්ස්චි වෙත මෙම න්‍යායධරයින් බලපා ඇති බව නොරහසක් නමුත් Boothman (2008) පෙන්වා දෙන්නේ ග්‍රාම්ස්චිගේ සිරගත සටහන්වලින් හෙජමනිය පිළිබඳ අදහස් නැවත මතුවීම තෙක් එය හුදෙක් නායකත්වය යන සීමාව තුළ සාකච්ඡා කළ බව ය. 1917 වර්ෂයේ රුසියානු අත්දැකීම් (අද්දැකීම්) සහ ලෙනිනියානු ලේඛනවල මෙම පදයෙහි අර්ථය යන කරුණු ග්‍රාම්ස්චිට සිය සිරගත සටහන් තුළ "හෙජමනිය" යන පදය භාවිත කිරීම සඳහා උත්ප්‍රේරක විය. මාක්ස් සිය න්‍යාය තුළ වැඩි අවධානයක් ආර්ථික කාරණා වෙත ලබා දුන්න ද සංස්කෘතික සහ උපරි ව්‍යුහය තුළ ක්‍රියාත්මක වන සංකීර්ණ සබඳතා හරහා හෙජමනිය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ ග්‍රාම්ස්චි අපගේ අවධානය ගෙනයයි. එසේ වුවත් මෙම සංකල්පය ඉරිදිපත් කිරීමේ පසුබිම සැලකීමේ දී ග්‍රාම්ස්චියානු ශාස්ත්‍රඥයෙකු වන ට්‍රනේට් බ්‍රවුන් යෝජනා කරන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ න්‍යාය රුසියානු කොමියුනිස්ට්වාදීන්ගේ සමකාලීන සංවාදයන් ආශ්‍රයෙන් හැඩ ගැසී ඇති බව යි (චාමින්ද, 2019). එහෙත් නොබර්ටෝ බෝබියෝ දක්වන්නේ මේ මතය පිළිගත නොහැකි බවත් මෙම යෙදුම සඳහා වැඩි දායකත්වයක් දක්වා ඇත්තේ ලෙනින්ට වඩා ස්ටාලින් විසින් බව ය (Dunn et al., 1994). කෙසේ වුව ද මෙම පදය සඳහා ග්‍රාම්ස්චි විසින් සම්පූර්ණ වශයෙන්

නව්‍ය අනුමිතියක් ලබා දෙන බව විශ්ලේෂණය කළ හැකි ය. Hoare සහ Sperber (2016) අනුව පළමු ව එමඟින් තවදුරටත් ධනපති පන්තියට විරුද්ධ අරගලයේ දී වැඩකරන පන්තියෙහි ක්‍රියාකාරිත්වය නියම කිරීම සිදු නොකරන නමුත් ඒ වෙනුවට න්‍යායාත්මක ව ඉතිහාසයෙහි කුමන අවස්ථාවක වුව ද කුමන ආකාරයෙහි හෝ "අණකිරීමෙහි" දේශපාලන ක්‍රියාවකට එනම් වෙනත් සමාජ කණ්ඩායමක් මත බලය යෙදවීම හැඳින්වීමට යොදාගත හැකි ය. දෙවනුව හෙජමනිය යන්නෙහි ග්‍රාම්ස්චියානු භාවිතය අවධාරණය කරන්නේ නායකත්වයෙහි සංස්කෘතිය, සදාචාරය සහ ඥානනාත්මක පැතිමාන සහ එය මෙම නායකත්ව මාර්ගය තුළ දී සම්පූර්ණයෙන් ප්‍රතිකථනය කිරීමක් සිදුවන බව ය. ඔවුන්ට අනුව අවසාන වශයෙන් කිව හැක්කේ හෙජමනිය යන්න ලෙනින් සඳහා උපක්‍රමයක් (විප්ලවය සඳහා) වූ බවත් ග්‍රාම්ස්චි සඳහා නිෂ්ටාවක් (දේශපාලනයෙහි) ලෙස තත්වාන්තරකරණය වූ බව ය. කෙසේ වුව ද පොදුවේ සැලකීමේ දී හෙජමනිය පිළිබඳ ග්‍රාම්ස්චිගේ අදහස් වඩා පැහැදිලි ව ඔහුගේ සිරගත සටහන් තුළ හඳුනා ගත හැකි අතර මෙනිසා රුසියානු ආභාසය සහ සම්භාව්‍ය මාක්ස්වාදයෙහි ආභාසය තුළ හිඳීමින් ඉතාලියානු සමකාලීන සමාජ දේහය පිළිබඳ ව ද වඩා තියුණු අවබෝධයක් සහිත ව මෙම අදහස් ඉදිරිපත් කරයි. මාක්ස් සහ ලෙනින්ගේ පන්ති සවිඥානිකත්වය පිළිබඳ අදහස වඩා සංවර්ධනය කිරීමක් ලෙස හෙජමනිය විශ්ලේෂණය කළ හැකි ය. ලෙනින් විසින් රුසියාවෙහි කම්කරු පන්තියට පන්ති සවිඥානිකත්වය පිටතින් එන්නත් කිරීම සඳහා විප්ලවවාදී බෝල්ෂෙවික් පක්ෂයක උවමනාව අවධාරණය කරන බව යි. මාක්ස් විසින් සිය විග්‍රහය තුළ පෙන්වා දෙන්නේ කම්කරු පන්තිය පරාරෝපණය වී තිබීම හේතුවෙන් පන්ති සවිඥානිකත්වයක් නොමැති අතර ම ඔවුන් වෙත ඇත්තේ ව්‍යාජ පන්ති සවිඥානිකත්වයක් බැවින් විප්ලවවාදී පක්ෂයක කාර්යභාරය වන්නේ ඔවුන් වෙත පිටතින් මෙම පන්ති සවිඥානිකත්වය ඇති වේ (Marx සහ Engals, 1888). මේ අනුව මාක්ස්වාදී භාවිතයෙහි පැවතී (පැවති) සීමා අතික්‍රමණය කරමින් ග්‍රාම්ස්චි විසින් හෙජමනිය සම්බන්ධයෙන් දේශපාලනික, බුද්ධිමය සහ සදාචාර නායකත්වය යන කොටස් එකතු කරයි.

හෙජමනිය පිළිබඳ සාකච්ඡාවේ දී Gundogan (2008) මෙන් ම Lves (2004) තව දුරටත් පුළුල් වශයෙන් පෙන්වා දෙන්නේ හෙජමනිය යන්න ප්‍රතීයමාන වන්නේ බලහත්කාරය හෙවත් ආධිපත්‍යයෙන් සහ බාහිර බුද්ධිමය සහ සදාචාරාත්මක දිශාවන් තුළිනුත් ලෙස ය. මේ නිසා ම හෙජමනිය පිළිබඳ වටහා ගැනීමේ දී පළමු ව ආධිපත්‍යමය ස්වරූපය සහ ඒ වටා වූ සදාචාර සහ බුද්ධිමය දිශාවෙන් දිශාගත විය යුතු බව ග්‍රාම්ස්චි අවධාරණය කරයි (Gramsci, 2000). මින් පෙනී යන්නේ යම් පන්තියක් මත හෙජමනිය පවතිනවා නම් ඔවුන් විසින් මතවාදීමය ආධිපත්‍යය මෙන් ම කුඩා ප්‍රමාණයක බලහත්කාරය ද පවත්වාගෙන යා යුතු බව ය. එහෙත් මෙහි දී අවධාරණය කළ යුතු වැදගත් කාරණයක් තිබේ. එනම් ග්‍රාම්ස්චි හෙජමනිය සම්බන්ධයෙන් සියලු කාල සහ අවකාශ සඳහා වලංගු වන තනි නිර්වචනයක් ලබා නොදුන් බව ය. හෙජමනිය යන්න ග්‍රාම්ස්චිට අනුව සත්‍ය වශයෙන් ම බහුමානීය සංකල්පයකි. එමඟින් හුදෙක් සමාජ කණ්ඩායමක දේශපාලන නායකත්වයක් පමණක් අඟවනු නොලබන නමුත් උපස්තම්භක කණ්ඩායමේ හෝ කණ්ඩායමක, සන්ධානයක උපායමාර්ග පෙන්වා දෙයි. එකඟත්වයෙහි සහ බලහත්කාරයෙහි සහජීවනය බලයෙහි මූලධාර්මික යන්ත්‍ර ශාස්ත්‍රය ලෙස ද, සංස්කෘතික ජීවිතයෙහි දෘෂ්ටිවාදීමය හු දර්ශනයෙහි පිළිසැකසුමක් ලෙස ද, සදාචාර සහ විශ්වීය දේශපාලන ව්‍යාපෘතියක ප්‍රකාශනය සහ ගොඩනැගුම ලෙස ද, ප්‍රකෘති අධ්‍යාපනික සම්බන්ධයක් සහ සවිඥානිකත්වයෙහි සදාචාර

මෙන් ම බලහත්කාරයෙහි වෙනස්වීමක් ලෙස ද හෙජමනිය යන්න විග්‍රහ කරයි (Gramsci, 2000). සම්භාව්‍ය මාක්ස්වාදය පිළිබඳ විවේචනාත්මක දෘෂ්ටියකින් ග්‍රාම්ස්චි දක්වන්නේ මාක්ස්ගේ ආර්ථික නියතිවාදය, පදනම සහ උපරි ව්‍යූහය අතර සබඳතාව වඩා යාන්ත්‍රික ස්වරූපයක් පෙන්නුම් කරන බව යි (Gramsci, 2000). මෙකී කාරණය සම්බන්ධ ව ග්‍රාම්ස්චි දෙවන ජාත්‍යන්තරයෙහි මාක්ස්වාදීන් සමඟ නිරන්තර ගැටුමක් පවත්වාගෙන තිබිණි (චාමින්ද, 2019). මේ හේතුවෙන් යාන්ත්‍රික වටහා ගැනීම වෙනුවට පුළුල් බහුමානීය සහ සංයුක්ත වටහා ගැනීමක් තුළ හෙතෙම සිය න්‍යායික සූත්‍රගතකරණය සිදු කරයි. මේ අනුව හෙජමනිය යනු අධිකාරිත්වය සහ එකගත්වය හෙවත් සදාචාරමය කැමැත්ත යන ද්විත්වයෙහි එකතුවක් ලෙස ග්‍රාම්ස්චි පෙන්වා දෙන අතර හෙජමනිය යන්න හුදෙක් ම සදාචාර දේශපාලන ප්‍රපංචයක් ලෙස ග්‍රාම්ස්චි විසින් පෙන්වා නො දෙයි. ඒ වෙනුවට ඔහු යෝජනා කරන්නේ හෙජමනිය දේශපාලන ප්‍රපංචයක් මෙන් ම ආර්ථික ප්‍රපංචයයක් ද ලෙසිනි (Gundogan, 2008).

ග්‍රාම්ස්චිට අනුව හෙජමනිය යනු ස්වාභාවික දෙයක් හෝ යම් පන්තියක් හෝ ජන කණ්ඩායමක් මත නෛසර්ගික ව පිහිටන්නක් නො වේ. එය ආරෝපණය කරන ලද යමක් වන අතර ම එය සමාජ පදනම දක්වා ම මුල්බැස ගෙන තිබෙයි (Lves, 2004: Dunn et al., 1994: Gundogan, 2008). මේ අනුව යම් ජන කණ්ඩායමක් හෝ සමාජ පන්තියක් තමන් මත ආධිපත්‍යය හෙවත් හෙජමනිය ස්ථාපිත කරගැනීම සඳහා ස්වයං පරිවර්තනයකට ලක් වීමට සිදු වෙයි. එම පරිවර්තනයෙහි අදියර තුනක් හඳුනා ගත හැකි ය.

1. ආර්ථික ස්ව-අභිලාෂයන් පදනම් කරගත් ගොනුවීම්වල (Economic – Corporate) අදියර. මේ අදියරේ දී පුද්ගලයන් තම ආර්ථික ස්ව-අභිලාෂ ඉටු කර ගැනීම සඳහා සංවිධානාත්මක ක්‍රියාකාරිත්වය වටහා ගනී.
2. තම අභිලාෂවලට සමාන්තර අභිලාෂ ඇති සෙසු කණ්ඩායම් සමඟ සහයෝගීත්වයක් ගොඩ නගා ගැනීමේ උත්සාහයක් හට ගනී.
3. අදාළ සමාජ කණ්ඩායමේ අභිලාෂයන් සෙසු සමාජ කණ්ඩායම් විසින් ද ස්වකීය පොදු ලෝක දැක්ම ලෙස ස්වීකරණය කොට බාරගනු ලබන වඩාත් වර්ධනීය තත්ත්වය (Hoare සහ Sperbe, 2016: චාමින්ද, 2019: Gundogan, 2008).

මෙහි දී වඩා වැදගත් කරුණ වන්නේ ඉහත දෙවන අදියරේ සිට තෙවන අදියරය දක්වා එනම් තම කණ්ඩායමේ පොදු ආර්ථික අභිලාෂ සෙසු සමාජ කොටස්වල පොදු අභිලාෂ, පොදු ලෝක දැක්ම බවට පත් කරගැනීමට යම් පන්තියක්, බලය සහිත පිරිසක් අසමත් වන්නේ නම් ඔවුන්ට හෙජමනික තත්ත්වයක් ගොඩනගා ගැනීමට නොහැකි වීම යි. Mayo (2015) ග්‍රාම්ස්චිගේ රචනා ඇසුරු කරමින් දක්වන්නේ ග්‍රාම්ස්චි (1926) සිය "දකුණේ ගැටලුවෙහි සමහර පැතිමාන" නම් ලිපියෙහි පෙන්වා දෙන්නේ කම්කරු පන්තියට හෙජමනික විය හැක්කේ ද, පාලක පන්තිය විය හැක්කේ ද හුදෙක් ම ඔවුන් විසින් සිය ස්වයං-ආර්ථික අභිලාෂ මැඩපවත්වා දුප්පත් ගැමියන් සහ දකුණේ බුද්ධිමතුන් දිනාගත හොත් පමණක් බව යි. Gundogan (2008) මෙන් ම Lves (2004) වැඩිදුරටත් පෙන්වා දෙන්නේ මෙම තෙවන අදියර වන විට එය ගෝලීය තත්ත්වයක් දක්වා වර්ධනය වී තිබිය හැකි බව ය. එනම් වැඩකරන පන්තියේ පෙරමුණු බලඇණියක් හරහා එක් බහුජන

ව්‍යාපාරයක් ගොඩනැගීමට ග්‍රාම්ස්චි උනන්දු වන අතර ඒ ව්‍යාපාරය සඳහා ටියුරින්හි මහල් නිවාසවල කම්කරුවන්, සාදිනියාවේ ගොවීන්, මධ්‍යම ඉතාලියෙහි කුඩා කඩ හිමියන්, නේපල්ස්හි කම්කරුවන් හා ඔවුනගේ භාර්යාවන් ඇතුළු පුළුල් ජන කණ්ඩායමක් මීට අන්තර්ග්‍රහණය කර ගැනීමේ උවමනාව ග්‍රාම්ස්චි පෙන්වා දී තිබේ. ඔවුනගේ නානාප්‍රකාර අභිලාෂ එක පොදු අභිලාෂයක් වෙත කේන්ද්‍රගත කරමින් එක ලෝක දෘෂ්ටියක් ගොඩනැගීම සහ ඒ ඔස්සේ සාමූහික එකඟත්වය යන්න නිර්මාණය කිරීමේ වැදගත්කම ද ග්‍රාම්ස්චි මෙහි දී අවධාරණය කරයි. හෙජමනිය සඳහා හැමවිට ම මෙම පොදු අභිලාෂ සහ පොදු එකඟතාව වැදගත් වේ. මෙහි දී සම්භාව්‍ය මාක්ස්වාදී රාමුවෙන් ඔබ්බට යමින් ස්ත්‍රිය, සමාජ නිර්-ප්‍රභූන් යන සකල බලමුළු විප්ලවීය ව්‍යාපාරය වෙත අන්තර්ග්‍රහණය කිරීම සම්බන්ධ ව ග්‍රාම්ස්චියානු අදහස්වල පවතින ඉදිරිගාමීත්වය ප්‍රශංසනීය වේ. මේ සම්බන්ධ ව Hoare සහ Sperber (2016) දක්වන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය සම්බන්ධ අදහස්වල මෙම මුඛ්‍ය කොන්දේසි ඉතා පරෙස්සමෙන් වෙන් කිරීම අවශ්‍ය බව ය. "පාරිසරික සංගතතාව" යන්නෙන් ග්‍රාම්ස්චි අදහස් කරනුයේ එක්තරා විශේෂිත ආර්ථික අභිලාෂ වෙත යොමු වූ කණ්ඩායම් අරමුණු සම්බන්ධ ව යි. Mayo (2015) ට අනුව පන්ති සවිඥානිකත්වයෙහි වෙනස් වීම අත්‍යවශයෙන් ම ඉල්ලා සිටින්නේ පාරිසරික-සංගතතාව වෙතින් සදාචාර-දේශපාලන සැලසුම් වෙතට අනුරූප වීම සඳහා ය. ග්‍රාම්ස්චි මෙම ක්‍රියාවලිය මනෝවිද්‍යාත්මක මෙන් ම දේශපාලනික වශයෙන් ද දකින අතර එය catharsis ලෙස හඳුන්වයි. එය ඇරිස්ටෝටල්ගේ පොයෙටික්ස් (335 BCE) ග්‍රන්ථයෙන් ලබාගත් පදයකි. ග්‍රාම්ස්චි මෙම වෙනස දුටුවේ එක්තරා දුර්ලභ තීව්‍ර වෙනස්කමක් ලෙස වන අතර මෙම ක්‍රියාවලියෙහි මාතෘකාව හුදෙක් තනි පුද්ගල හෝ කණ්ඩායම් අභිලාෂයන්ගෙන් ඔබ්බට අනෙකුත් සමාජ කණ්ඩායම් සහ පුද්ගල අභිලාෂ දිනා ගැනීම දක්වා ගමන් කරන ලෙස ය. ග්‍රාම්ස්චි (1999) මෙය සාරාංශගත කරනුයේ ධනපති පන්තියේ සාමාජිකයින් ඔවුන් විසින් ම සදාචාර රාජ්‍යයක් ගොඩනැගීමට සහ පාලනය කිරීමට මෙවැනි ක්‍රියාවලියක් මඟින් ම සූදානම් වන බව ය. තව ද ග්‍රාම්ස්චි විසින් සදාචාර-දේශපාලනය යන්න භාවිත කරනුයේ පාරිසරික-සංගත අරමුණු ගෝලීය වශයෙන් එක කණ්ඩායමක අරමුණුවල සිට තවත් කණ්ඩායමක අරමුණු වෙත විපරිවර්තනය වීමේ මොහොතක් හැඳින්වීම සඳහා යි. එසේ ම විශේෂයෙන් මෙම කණ්ඩායම් ශක්තිමත් හෙජමනික කණ්ඩායමක උපස්ථම්භක සම්බන්ධතාවක් සඳහා නැගී සිටිය හැකි ලෙස යි.

Boothman (2008) දක්වන ආකාරයට හෙජමනිය පිළිබඳ සංකල්පය කේන්ද්‍රගත වන්නේ ග්‍රාම්ස්චිගේ සිවිල් සමාජය පිළිබඳ සංකල්පයෙහි වන අතර ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ අදහස පදනම් වන්නේ මාක්ස්ගේ "ව්‍යාජ සවිඥානිකත්වය" පිළිබඳ සංකල්පය මත ය. එනම් අදාළ රාජ්‍යයෙහි පාලිත පිරිස සමාජ ව්‍යූහය තුළ සිය නිර්-ප්‍රභූ ස්ථානගතවීම සම්බන්ධයෙන් දෘෂ්ටිවාදීමය අන්ධභාවයක් පවතී. මෙම ව්‍යාජ සවිඥානිකත්වයට ස්තුතිවන්ත වන්නට පාලිත පන්තින්හි දෘෂ්ටිවාදීමය සැකැස්මෙහි සැබෑ සවිඥානිකත්වය වසන් වී තිබේ. මේ නිසා ම එය එක්තරා ආකාරයකට අධ්‍යාපනික ක්‍රියාවලියක් බව දක්වන Mayo (2015) අපගේ අවධානය යොමු කරවනුයේ හෙජමනිය යනු හුදෙක් අධිපති කණ්ඩායමේ පාලනය කිරීමේ උපකරණයක් හෝ නිර්-ප්‍රභූ කණ්ඩායම් මත ආධිපත්‍යය පැතිරවීමේ උපකරණයක් ම පමණක් නොව එය සිය අධිපතීත්වය (අධිපතිත්වය) සහ පාලනය පිළිබඳ අධ්‍යාපනය ලබා ගැනීමේ උවමනාවක් ඇති පාලක පන්තියේ අපේක්ෂාවක් ද වන බව යි. හෙජමනිය

සම්බන්ධ මෙවැනි අදහසක් ස්ත්‍රී-පුරුෂ සමජභාවීය පැතිකඩ ඔස්සේ යමින් Budgeon (2014) පෙන්වා දෙයි. හෙජමනියෙහි පවතින විශේෂත්වය වන්නේ ද පාලිත පිරිස විසින් තමන් පාලන වනවා ද යන්න පවා නොදැන පාලනයට ලක්වීම සහ එකී පාලනයට සහාය දැක්වීම ය. මෙම තත්ත්වය ඇති වීම කෙරෙහි පාලන තන්ත්‍රය හොබවන පිරිස විසින් දෘෂ්ටිවාදීමය වශයෙන් පාලිත පිරිස වෙත ගෙන යන බලය ඉතා වැදගත් වෙයි. ලුවී අල්තූර් ග්‍රාම්ස්චිගේ මෙම අදහස් පිළිබඳ සලකමින් පෙන්වා දෙන්නේ "දෘෂ්ටිවාදය යන්නට භෞතික පැවැත්මක් ඇත යන්න යි" (චාමින්ද 2019). එනම් තමන් පාලන වන බව වත් නොදැනෙන තරමට පාලන වීම ව්‍යූහගත වී ඇති අතර ම එම බලය විසින් ගොඩ නගන සුජාතභාවය නිලින (නිලීන) යමක් බවට පත්ව තිබේ. මෙනිසා ම දෘෂ්ටිවාදය යන්න සවිඥානික තලය අතික්‍රමණය කොට අවිඥානික තලය වෙත ළඟා වෙයි. මෙම ළඟාවීම විසින් පාලිතයා තව දුරටත් පාලනයට යටත් වීම මතු නොව එකී පාලනයට කැමැත්තෙන් සදාචාරමය අරුතින් පාලනයට ලක්වීම දක්වා ස්ථානගත කරයි. හෙජමනියෙහි ඒජන්තයින් වන්නේ බුද්ධිමතුන් ය. ඔවුනගේ කාර්යභාරය වන්නේ හෙජමනිය සහ සාමාන්‍ය බුද්ධියෙහි විප්ලවයෙහි සමපාත වීම පවත්වාගෙන යාම යි (Gramsci, 1999). මේ නිසා ම හෙජමනිය යන්න අත්‍යවශයෙන් ම එක්තරා අධ්‍යාපනික සම්බන්ධයක් බව අපට හඳුනා ගත හැකි ය.

Boothman (2008) දක්වන්නේ ග්‍රාම්ස්චියානු ඇඟවුම තුළ හෙජමනිය යන්න බුද්ධිමය සහ සදාචාර නායකත්වයෙහි ක්‍රියාවලියක් හරහා ආධිපත්‍යයට විෂය වන හෝ නිර්-ප්‍රභූ කණ්ඩායම පාලක පන්තියේ ආධිපත්‍යයට යටත් වීමත් එමගින් ඔවුනගේ ම ආධිපත්‍යය දියකර හැරීම හැඳින්වීම සඳහා බලහත්කාරී හෝ එකඟත්වය මත පදනම් ව තම අප්‍රධාන/බල රහිත ආස්ථානය පිළිගැනීම සිදුවන බව ය. එනම් මෙය අපට විග්‍රහ කළ හැක්කේ නිර්-ප්‍රභූ කණ්ඩායම විසින් සමාජ ව්‍යූහය තුළ සිය දෙවන තැන, බල රහිත භූමිකාව දෙන ලද්දක් ලෙස බාර ගැනීම යන්න යි. ඒ සඳහා බුද්ධිමය සහ සදාචාරමය නායකත්ව ක්‍රියාවලියකට ඔවුන් භාජනය වීමත් එමගින් තවදුරටත් විපරිවර්තනයට ලක්වන ඔවුනගේ පොදු විශ්වාස සහ පිළිගැනීම් හරහා පාලක පන්තියෙහි හෙජමනිය ස්ථාපනය වෙයි. නිදසුනක් ලෙස ස්ත්‍රී-පුරුෂ සමජභාවීය අගයන් සහ ප්‍රතිමාන නියත වශයෙන් ම ස්ත්‍රියට සහ පුරුෂයාට සමාජයක වෙනස් ස්ථාන ද්විත්වයක් ලබා දුන්න ද ස්ත්‍රිය කෙරෙහි බලපාන මෙම අසාධාරණ ව්‍යූහය දෙන ලද්දක් ලෙස ස්ත්‍රීන් සහ පුරුෂයින් විසින් පොදුවේ පිළිගැනෙයි. එය සමාජයෙහි පොදු විශ්වාසයක් බවට පත්වෙමින් සමාජානුයෝජන ක්‍රියාවලිය හරහා ඉදිරි පරම්පරාවලට ද සම්ප්‍රේෂණය වෙයි. මෙම තත්ත්වය කෙරෙහි ස්ත්‍රී-පුරුෂ සමජභාවිය (සමජභාවීය) හෙජමනික ස්වරූපය බලපෑම් කරන බව විශ්ලේෂණය කළ හැකි ය. Mayo (2015) දක්වන්නේ තමා පෞද්ගලික ව උනන්දු වන්නේ හෙජමනියෙහි වඩා විස්තීර්ණ සංකල්පය සම්බන්ධ ව බව යි. එනම් එකඟත්වය, බලහත්කාරය/මර්දනය යන්න යි. මන්ද එය ග්‍රාම්ස්චිගේ "අඛණ්ඩ රාජ්‍ය" සමඟ ඉතා කිට්ටුවෙන් ගමන් කරයි. සියලු සර්වග්‍රාහී රාජ්‍යවල එක ම අවස්ථාවෙහි මර්දනයෙහි සහ එකඟත්වයෙහි පැතිමානවල සංයුක්ත තත්ත්වයක් පවතින අතර මෙම පැතිමාන අතර විභේදනය විසින් ග්‍රාම්ස්චි සඳහා ද ස්වයං-ගවේෂණමය අදහසක් ඇති කෙරිණි. අල්තුසර් උපුටමින් චාමින්ද (2019) දක්වන්නේ යථාර්ථය තුළ මෙම ද්විත්වය එකිනෙකින් වෙන්කළ නොහැකි අතර ම ඊට හේතුව වන්නේ, සියයට සියයක් ම අවරෝධන යාන්ත්‍රණයක් (Repressive Apparatus) නොමැති අතර ම සියයට සියයක් මතවාදී යාන්ත්‍රණයක් ද (Ideological Apparatus)

නොමැති බව යි. එම ද්විත්වය විසින් එකිනෙකාගේ පැවැත්ම සඵල කරන බව විශ්ලේෂණය කළ හැකි ය. මෙම සබඳතා පිළිබඳ ස්ත්‍රීවාදී දෘෂ්ටියකින් සලකා බලන කල ද හෙජමනියෙහි පවතින අපෝහක ස්වභාවය හඳුනා ගත හැකි ය. එනම් ස්ත්‍රී-පුරුෂ සමජභාවීය සබඳතා හරහා බොහෝ සමාජවල පුරුෂාධිපත්‍යමය රාමුවක් ස්ථාපිත කොට තිබේ. එහෙත් අදාළ රාමුව කිසිදු විටෙක සියයට සියයක් මර්දනය මඟින් ක්‍රියාත්මක නොවන අතර ම එම මර්දනය වසන් වන ආකාරයෙහි මතුපිට තුළ ගැබ්වූ උත්කර්ෂයට නැංවීමක් ද පවතී. උදාහරණයක් ලෙස මාතෘත්වය යන්න අතිශය විශාල වශයෙන් ආසියාතික සමාජ තුළ උත්කර්ෂයට නැංවෙන අතර ම "ලේ කිරි වන්නේ සෙනෙහස නිසා ය" වැනි ව්‍යවහාරික දැනුම මඟින් මෙම උත්කර්ෂයට නැංවීම සෞන්දර්යකරණය කොට ද තිබේ. එහෙත් අදාළ උත්කර්ෂයට නැංවීමට මෙපිටින් දරුවා පිළිබඳ වගකීම සහ ගෘහස්ත කාර්යය යන්න ස්ත්‍රිය කෙරෙහි අසාධාරණ ලෙස එකට සම්බන්ධ කොට තිබේ; ස්ත්‍රියගේ වගකීමක් කොට තිබේ. පුරුෂයා මෙන් ම ස්ත්‍රිය මෙම තත්ත්වය දෙන ලද්දක් ලෙස බාර ගැනීම හරහා ස්ත්‍රී-පුරුෂ සමාජභාවය සහ පුරුෂාධිපත්‍ය විෂයෙහි පවතින හෙජමනික ස්වරූපය නිලීන යමක් බවට පත්ව ඇති වග පෙන්වා දිය හැකි ය.

ගුණසිංහ (2011) පෙන්වා දෙන ආකාරයට යම් සමාජ පන්තියක් උවමනාවට වඩා බලහත්කාරය හෝ මර්දනය දියත් කරන්නේ නම් එහි හෙජමනික ස්වරූපයකට වඩා ඇත්තේ "මර්දන තන්ත්‍රයක්" වේ. Gramsci (1999) ට අනුව එවැනි පාලන තන්ත්‍රයක බලය ඉතා කෙටි කාලීන වන අතර ඊට විරුද්ධ ව සමාජ කණ්ඩායම් නැගී සිටීමේ ප්‍රවණතා මතු වීමේ වැඩි ඉඩක් පවතී. මන්ද එම මර්දනය ඉතා ම පෙනෙන සහ දැනෙන සුලු දෙයක් බැවිනි. නිදසුනක් ලෙස තවදුරටත් Gramsci (1999) දක්වන්නේ කැමැත්ත සහ බලහත්කාරය අතර කෙනෙකුට හඳුනාගත හැකි තුන්වන යෙදුමක් ඇති බව යි. එනම් දූෂණය හෝ ප්‍රෝඩාව යි. ග්‍රාම්ස්චිට අනුව බලයෙහි මෙම ආකාරයන් විශේෂයෙන් මතු වී පෙනෙන්නේ එක්තරා විශේෂිත අවස්තාවල දී එනම් හෙජමනික කෘත්‍යයන් තවදුරටත් ව්‍යායාමය කිරීමට නොහැකි අවස්ථාවල දී ය. එසේ ම එවැනි අවස්ථාවක මර්දනය ක්‍රියාත්මක කිරීම වඩා අවදානම් විය හැකි ය (Hoare සහ Sperber 2016). මෙනිසා හෙජමනිය යනු කිසිසේත් ම ඍජු බලහත්කාරය නොවන අතර හොඳ හෙජමනික සැකැස්මක් වෙතින් මර්දනය පිළිබඳ දැනුවත් ඉඟි ලබා දීම දුලබ වශයෙන් සිදුවන්නක් බව පැවසිය හැකි ය.

මෙම තත්ත්වය ලංකාව ආශ්‍රයෙන් සලකා බැලීමේ දී 2015 මහා මැතිවරණ අවස්ථාව සුවිශේෂී ව සිහිපත් කළ හැකි ය. පැවති පාලන තන්ත්‍රය පිළිබඳ කලකිරුණු බොහෝ පාර්ශ්ව විසින් මතු කළ ප්‍රබල කරුණක් වන්නේ අදාළ පාලන තන්ත්‍රය රෙජීමයක් දක්වා වර්ධන වී ඇති බවත් මර්දනය යන්න එහි ප්‍රමුඛ උපකරණය බවත් ය. එනිසා ම එම තත්කාලීන පාලනය විසින් යුද්ධ ජයග්‍රහණය හරහා ගොඩනගා ගත් හෙජමනිය එහි හෙජමනික ස්වරූපය වෙතින් ගිලිහෙමින් මර්දනය වෙත වඩා ළං ව ක්‍රියාත්මක වීම හරහා බලය අහිමිවීම දක්වා ගමන් කළ බව විශ්ලේෂණය කළ හැකි ය. මන්ද සහයෝගිත්වය සහ සදාචාරය මත මෙන් ම මර්දනය මත ගොඩනැගිය යුතු ව තිබූ අදාළ හෙජමනිය පශ්චාත් යුද්ධ වකවානුව තුළ වර නැගුණේ මර්දනය වෙත වඩා සමීප වෙමිනි. මෙනිසා ම යම් නායකයෙකුට හෝ පාලන ක්‍රමයකට හෙජමනික වීමට නම් අදාළ පාලනයෙහි පවතින මර්දනය සහ සදාචාරමය එකඟත්වය පිළිබඳ තාර්කික සහ දේශපාලනිකමය ගණන් තැබීමක් අත්‍යවශ්‍යයෙන් ම පැවසීම අතිශයෝක්තියක් නො වේ.

ග්‍රාම්ස්චි විසින් මෙම අදහස් ඉදිරිපත් කරන ලද්දේ සමකාලීන ඉතාලියානු ප්‍රශ්න අලළා බව ඉහත දී ද පෙන්වා දෙන ලදී. එම තත්ත්වය තුළ ඔහු කම්කරු ජනතාවගේ සටන් සඳහා දකුණේ ගොවිජනතාවගේ සහාය නොලැබීම පිළිබඳ ප්‍රශ්නය සාකච්ඡා කරයි. එහි දී ග්‍රාම්ස්චි පෙන්වා දෙන්නේ ඉතාලියේ උතුර සහ දකුණ වශයෙන් ප්‍රධාන බෙදුම්කඩනයක් තිබූ අතර එහි දී ප්‍රාදේශීය බෙදීම අභ්‍යන්තරයෙහි වූ පාන්තික තත්ත්ව වෙත ගොවිජන දුරවබෝධය හරහා ඓතිහාසික හවුලක් නිර්මාණය වීමේ මග අවහිර වූ බව යි. ඒ වෙනුවට නිර්මාණය වී තිබුණේ ගොවි හවුලක් වන අතර ඊට ප්‍රතිවිරුද්ධ ව කම්කරු පන්තිය විසින් අනෙකුත් පීඩිත කොටස් සහිත පෙරමුණු බලඇණියක් හෙවත් ප්‍රති-හෙජමනියක් නිර්මාණය කිරීමේ උවමනාව ග්‍රාම්ස්චි විසින් අවධාරණය කෙරේ (Lves, 2004). ග්‍රාම්ස්චි වැඩිදුරටත් දක්වන්නේ එසේ නියමාකාර හෙජමනියකින් තොර ව සිදුකරන විප්ලවය අක්‍රිය විප්ලවයක් (ග්‍රාම්ස්චිට අනුවැ සැබෑ විප්ලවයෙන් තොර විප්ලවයක්) බවට පත්වන බව ය (චාමින්ද, 2019 ෑ Lves, 2004). මෙම අක්‍රිය විප්ලවය යන පදය ග්‍රාම්ස්චි, Vincenzo Cuoco ගෙන් ලබාගත්ත ද ඔහු මෙය භාවිත කරමින් පෙන්වා දෙන්නේ අක්‍රිය විප්ලවය මඟින් ජනතාවගේ ලෝක දැක්ම වෙනස් නොකරන බව ය. එනම් හුදෙක් යම් පන්තියක් බලය ලබා ගැනීම අක්‍රිය විප්ලවයක් වන අතර එම බලය තහවුරු කරගැනීම සඳහා සියලු පිරිස්වල ලෝක දැක්ම හැඩගැස්වීමේ දෘෂ්ටිවාදී කාර්යය අදාළ බලය සහිත පිරිස විසින් සිදුකළ යුතු ය (Lves, 2004). නොඑසේ නම් එම පිරිසට හෙජමනික තත්ත්වයක් ස්ථාපනය කරගැනීමේ නොහැකියාවට සහ පසුව බලය අහිමි වීමට ද මුහුණ දීමට සිදුවන බව ග්‍රම්ස්චිගේ අදහස් ආශ්‍රයෙන් උකහා ගත හැක. මෙනිසා ම ග්‍රාම්ස්චි අවධාරණය කරන්නේ වැඩකරන ජනතවගේ හෙජමනිය ක්‍රියාකාරී විප්ලවයකින් ඉදිරියට පැමිණිය හැකි අතර එය අඛණ්ඩ හෙජමනියක් සහ සත්‍ය ජනප්‍රිය පොදුජන භාෂාවක් බවට පත්විය යුතු බව ය. Riley (2011) දක්වන ආකාරයට හෙජමනිය ගොඩනගා ගැනීමට හා පවත්වාගෙන යාමට යම් සමාජ පන්තියක හෝ කණ්ඩායමක ලෝක දැක්ම සමාජයෙහි පොදු දැක්ම බවට පරිවර්තනය කිරීම සඳහා දරන බුද්ධිමය සහ සදාචාර ප්‍රයත්නයක් තිබිය යුතු ය. ඒ අනුව පාලක පන්තියක හෙජමනිය වෙනස් කිරීම සඳහා ද දෘෂ්ටිවාදී අරගලයෙහි අවශ්‍යතාව ග්‍රාම්ස්චි විසින් වැඩිදුරටත් පෙන්වා දෙයි (Gramsci, 2000). එනම් දෘෂ්ටිවාදීමය වශයෙන් සුජාතභාවය ලබාගැනීම සහ එම සුජාතභාවය සමාජ පදනම තුළ පොදුවේ ප්‍රතීයමානවන තෙක් ම කිසිදු පාලන ක්‍රමයකට හෙජමනික තත්ත්වයක් වෙත ළඟා වීමේ නොහැකියාවක් ඇති බව විශ්ලේෂණය කළ හැකි ය.

මෙම පොදු අභිලාෂ නියෝජනය කිරීම සහ දෘෂ්ටිවාදීමය සුජාතභාවය පිළිබඳ තව දුරටත් අදහස් දක්වන ග්‍රාම්ස්චි ප්‍රංශ විප්ලවය තුළ ''ජැකොබින්''ගේ භූමිකාව ගෙනහැර දක්වයි. එනම් හෙජමනිය නිර්මාණය වීම සඳහා පොදුජන අභිලාෂ නියෝජනය වීමේ අවශ්‍යතාව පෙන්වා දෙන ග්‍රාම්ස්චි දක්වන්නේ ජැකොබින් විසින් ''අනාගත අපේක්ෂා නියෝජනය කරනු ලැබූ අතර'' ප්‍රංශ ධනපති පන්තියේ පමණක් නොව සමස්ත ජාතියේ ම අභිලාෂ එමඟින් ආමන්ත්‍රණය සහ නියෝජනය වන ආකාරය යි. (Lves, 2004). ග්‍රාම්ස්චිගේ අදහස් සලකමින් Mayo (2015) පෙන්වා දෙන්නේ ග්‍රාම්ස්චිගේ හෙජමනිය යන පදය ප්‍රධාන සංකල්ප දෙකක් සමග සංකල්පීය ආශ්‍රයක් පවත්වාගෙන යන බව ය. එනම් ''ජැකොබින්වාදය''(Jacobinism) සහ ''ජාතික-ජනතා සාමූහිකය'' (National-popular) සමඟ වන අතර එය අත්‍යවශ්‍යයෙන් ම ප්‍රතිවිරුද්ධ වන සංකල්ප ද්විත්වයක් ද පවතී.

එනම් "ආර්ථිකවාදය" (Economism) සහ "ආර්ථික-ගොනුවීම" (Economic-Corporatism) යන්න යි. මෙම දැනීම ඔස්සේ හෙජමනිය අත්‍යවශ්‍යයෙන් ම ආර්ථිකමය අධිපති (Economically Dominant) හෝ විභවාත්මක අධිපති (Potentially Dominant) නිෂ්පාදන විධියක් මෙන් ම එක්තරා මූලධාර්මික සමාජ පන්තීන් (ධනපතීන් හෝ කම්කරුවන්) වනු ඇත. එසේ නමුත් එම සංකල්පයේ සැබෑ ස්වභාවය නම් දේශපාලනික මාර්ගයෙන් පන්ති සහයෝගිත්ව සන්ධානයක් වෙත ආර්ථික පන්තීන්ගේ අභිලාෂ මත්තෙන් විස්තාරණය වීමක් බව දැක්විය හැකි ය. එනම් එය හුදෙක් ආර්ථික අභිලාෂ අතික්‍රමණය කිරීමකි. සිරගත සටහන් තුළ හෙජමනියෙහි මෙම අර්ථය පවතින නමුත් එය ප්‍රධාන විධි දෙකක් ඔස්සේ නැවත පුළුල් ලෙස අවබෝධ කොටගත හැකි ය. පළමු ව, එය හුදෙක් කම්කරු පන්තියෙහි නායකත්වය හෝ එක්තරා මොහොතක් සඳහා ව්‍යවහාරික කර නොගන්නා නමුත් ඉතිහාසයෙහි කාල වකවානුවක අනෙක් පන්තිවල රීතීන්/ පාලනයන් සඳහා ද භාවිත කරයි. දෙවනුව එය ගුණාත්මක ව විකරණය කිරීමක් දැකගත හැකි ය. එමඟින් සමාන නිර්-ප්‍රභූ කොටස් මත බලපවත්වන හෙජමනිය සංස්කෘතිය, සදාචාරය සහ දෘෂ්ටිවාදී නායකත්වය අදහස් කිරීම සඳහා පෙනී සිටියි. ඉහත දක්වන ලද අරුතින් හෙජමනිය (කෘශේගේ සදාචාරමය-දේශපාලනය (ethico-political) මැදිහත්වීම හරහා ග්‍රාම්ස්චි මෙම අරුතින් හෙජමනිය යන්න නිර්මාණය කරයි) යන්න අර්ථ දක්වන්නේ නව ආකාර දෘෂ්ටිවාදී භූමියක සැකැස්මක් වන අතර එය දේශපාලන, සංස්කෘතික සහ සදාචාර නායකත්වයකින් මෙන් ම අනුමැතියකින් ද සමන්විත වේ.

ග්‍රාම්ස්චි ඉතා පැහැදිලි ව පෙන්වා දෙන්නේ ආධිපත්‍යමය ප්‍රභූන් විසින් රාජ්‍ය එමෙන් ම ජනප්‍රිය සංස්කෘතිය, ජන මාධ්‍ය, අධ්‍යාපනය සහ ආගම මගින් බලහත්කාරය සම්බන්ධ ඔවුනගේ ස්ථානයට අදාළ ව උපකාරවන දෘෂ්ටිවාදයක් ගොඩනගන බව ය. මේ නිසා ග්‍රාම්ස්චි විසින් හෙජමනිය යන්න අර්ථ දක්වන්නේ සමාජයෙහි නිර්-ප්‍රභූ කණ්ඩායම් මත ආධිපත්‍යධාරී කණ්ඩායම විසින් ක්‍රියාත්මක කරන පාලනයෙහි ආකාරයක් ලෙස ය (Boothman, 2008). ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ සාකච්ඡාව ඒක රේඛීය ව ඉදිරිපත් කිරීම අපහසුවන්නේ ඔහු ඒ පිළිබඳ ගොඩනගන දැනුම සහ භාවිතය සංකීර්ණ සහ සාකල්‍ය හුරුවක් ගන්නා බැවිනි. එබැවින් ලිපිය තුළ මෙතෙක් දැක්වූ කරුණු බහුවිධ මානයක් ඔස්සේ විශ්ලේෂණාත්මක ව ඉදිරිපත් කර ඇත.

කෙසේ නමුත් ග්‍රාම්ස්චිගේ හෙජමනිය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවේචන ගැන අදහස් දක්වන Hoare සහ Sperber (2016) හෙජමනිය පිළිබඳ සංකල්පය ආකාර ද්විත්වයකට ඛණ්ඩනය කොට දක්වයි. ඔවුන් තර්ක කරනුයේ දේශපාලනික සැදුමක් (පන්තිමය නියෝජිතයින් වැනි) ඇතුළත තනි හෙජමනික ධ්‍රැවයක් තිබිය නොහැකි බවත් සියලු ම තනි පුද්ගල සහ කණ්ඩායම් අභිලාෂ සම්පූර්ණ වශයෙන් සන්ධානකරණ ක්‍රියාවලිය හරහා ගොඩනැගූ ඒවා බවත් ය. තව ද නායකත්වය පිළිබඳ Laclau සහ Chantal (1992) දක්වන්නේ ග්‍රාම්ස්චිට අනුව සෑම හෙජමනික ගොඩනැගීමක තනි එක් එක්සත් කිරීමේ මූලධර්මයක් පවතින බව ය. එය මූලික පන්තියක් පමණක් විය හැකි ය. මෙම අදහස ප්‍රතික්ෂේප කරන Hoare සහ Sperber (2016) දක්වන්නේ හෙජමනිය කණ්ඩායම්වල සම්මේලනයක් ලෙස හෝ දේශපාලනයෙහි පරමාදර්ශී තත්ත්වයක් ලෙස ය. එසේ ම විශ්ලේෂණයෙහි සහ උපායමාර්ගවල උපකරණයක් ලෙස ය. තව ද ඔවුනගේ භාවිතය තුළ හෙජමනිය යන්න වඩා පුළුල් අර්ථයෙන් සමකාලීන සමාජ ව්‍යාපාර පිළිබඳ වටහා ගැනීම

සඳහා භාවිත කරන අතර ම ධනවාදයට විරුද්ධ අරගලය සඳහා එය සම්බන්ධ කරගනු ලබයි. එයට හේතුව වන්නේ මූලික ව ඔවුනගේ උනන්දුව මාක්ස්වාදයෙන් ඔබ්බට ගමන් කරන බැවිනි (Hoare සහ Sperber, 2016). හෙජමනිය සහ එහි භාවිතය පිළිබඳ වැඩි සැලකිල්ලක් දක්වමින් Mayo (2015) පෙන්වා දෙන්නේ තමා විසින් මෙම සංකල්පය අර්ථකරණය කිරීමට කැමති වන්නේ, වඩා ම හොඳින් සංවිධානය වූ තත්ත්වයක්, ගොඩනගන ලද විශේෂිත සමාජ යථාර්ථයක්, සහ එම යථාර්ථය විසින් උදෙක් ම එක විශේෂිත සමාජ කණ්ඩායමක අභිලාෂ වෙත සිය කොන්දේසිමය එකඟත්වයෙන් සහාය දීම සිදුවන බව ය. Mayo (2015) තවදුරටත් තර්ක කරනුයේ හෙජමනිය හුදෙක් සංයුක්ත වන්නේ දෘෂ්ටිවාදීමය බලපෑමක හෝ තරගකාරිත්වයකට පමණක් නො ව එය ''භාවිතයෙහි සහ අපේක්ෂාවෙහි සමස්ත පද්ධතියක් ලෙස ය.

හෙජමනිය පිළිබඳ ග්‍රාම්ස්චියානු අදහස් සහ පොදුවේ ග්‍රාම්ස්චිගේ අදහස් සම්බන්ධ ව විවේචන එල්ල කරන කණ්ඩායම් අතුරින් පැන නගින ප්‍රධාන විවේචන කිහිපයක් Lears (1985) පෙන්වා දෙයි. ඔහුට අනුව සමහර විචාරකයින් ග්‍රාම්ස්චි වෙත දක්වන එක් විවේචනයක් වන්නේ හෙජමනිය යන්න ''අසත්‍යාක්ෂණය කළ නොහැකි උපන්‍යාසයක්'' යන්න යි. නමුදු දෘඪ විද්‍යාවන්හි ආකාරයට ම ''උපන්‍යාස අසත්‍යාක්ෂණය'' යන්න සමාජීය විද්‍යාවන්ට අවශ්‍ය ද යන්න පිළිබඳ තරමක් ගැටලු සහගත නොවන්නේ ද යන්න විමසා බැලිය යුතු වේ. Aileen Kraditor උපුටමින් Lears (1985) තවදුරටත් පෙන්වා දෙන්නේ ඇය ආකාර දෙකකින් ග්‍රාම්ස්චිගේ අදහස් වෙත විවේචන එල්ල කරන බව ය. පළමු ව ඇය තර්ක කරන්නේ 1880-1917 කාලය ''තැති ගන්නා කාලයක්'' සහ මහා පරිමාණ කාර්මික ඒකාබද්ධ කිරීම් විසින් පැවති බලයට බලපෑම් කිරීම වර්ධනය කළ නමුත් එකල සංස්කෘතික හෙජමනියක් භාවිතයෙහි යෙදවූයේ නැති බව ය. මෙම විවේචනය එක්තරා අතකින් සත්‍ය නමුත් ග්‍රාම්ස්චියානු දෘෂ්ටියෙන් දහනම වන සියවස අගභාගය පිළිබඳ අදහසට එය සංගත බව Lears (1985) වැඩි දුරටත් පෙන්වා දෙයි. ඇයගේ අනෙක් විවේචනය වන්නේ, හෙජමනිය එකඟත්වයෙහි තේමාව සම්බන්ධ විචලනයන්ට සම්බන්ධ වීම යි. ඇය තර්ක කරන්නේ, ශ්‍රමිකයින් විසින් පෞද්ගලික පරිධිය තුළ ස්වාධිපත්‍යය හුවමාරු කරමින් වැඩබිමේ අවමානුෂකරණය (පුද්ගලයා යාන්ත්‍රික කිරීම) පිළිගැනීම තෝරාගත් බව යි. ග්‍රාම්ස්චි විසින් වැඩකරන ජනතාවගේ ආර්ථික අභිලාෂවලට මත්තෙන්, ඔවුනගේ චිත්තවේගමය සහ ආධ්‍යාත්මික අභිලාෂ වඩා බරපතල ව පවතින බව තීරණය කර තිබුණ නමුත් ශ්‍රමිකයින් සැබවින් ම රුදුණේ සමාජවාදී උවමනා සහ ඉල්ලීම් නොඇසෙන මානයේ ය. මෙනිසා ම ශ්‍රමික ප්‍රජාව පිළිබඳ ග්‍රාම්ස්චියානු පුරෝකථනය සැබෑ සමාජ දේහය තුළ එයාකාරයෙන් ම සිදු නොවීම නිසා ග්‍රාම්ස්චි විචාරකයින් අතර විවේචනයට පාත්‍ර වේ. Lears (1985) අනුව ග්‍රාම්ස්චි විසින් බලහත්කාරයෙහි විවිධාකාර ප්‍රවර්ග (රැකියා වියුක්තියට ඇති භය) නොසලකා හැර ඇති නමුත් එය බලහත්කාරය සහ එකඟත්වය යන ද්වි ධ්‍රැවීය සැකැස්ම පැවතිය හැකි අතර ම සමහර විට ඔහුගේ සූත්‍රගතකරණය තුළ දී ඉතා දරදඬු ආකාරයෙන් ඔහු ඔප්පුකිරීමට උත්සාහ ගෙන ඇත්තේ පන්ති ආධිපත්‍යය පිළිබඳ අනවශ්‍ය ප්‍රමාණයට සරල කරන ලද බලපත්‍රයක් බව ය. අනෙක් අතින් පොදුවේ ග්‍රාම්ස්චියානු න්‍යාය ස්ථානගත වන්නේ ව්‍යුහවාදී පදනමක බැවින් පශ්චාත් ව්‍යුහවාදීන් විසින් ව්‍යුහය සහ ව්‍යුහවාදය සම්බන්ධ ව එල්ල කරන විවේචන අත්‍යන්තයෙන් ම ග්‍රාම්ස්චිගේ අදහස් සඳහා ද අදාළ වෙයි. විශේෂයෙන් සර්ව-විශ්වීය ව්‍යුහාත්මක

ආකාරයට මිනිසා සහ ඔහු වටා ඇති දේශපාලන සබඳතා සම්බන්ධ ව ග්‍රාම්ස්චි අදහස් දැක්වුව ද පශ්චාත් ව්‍යුහවාදී න්‍යායධරයින් දක්වන්නේ මිනිසා සහ ඔහු වටා වූ දේශපාලනය යන්න සාර්ව අර්ථයෙන් වටහා ගැනීම සිදු කළ නොහැකි බව යි. එය අදාළ සන්දර්භයෙන් සන්දර්භයට, බල සබඳතාවෙන් බල සබඳතාවට ගතික බව පශ්චාත් ව්‍යුහවාදීහු පවසති. කෙසේ නමුත් මෙවැනි විවේචන පැවතිය ද හෙජමනිය සම්බන්ධයෙන් න්‍යායික සහ ප්‍රායෝගික මඟ පෙන්වීමක් ලබා දීම විෂයෙහි ග්‍රාම්ස්චියානු මැදිහත්වීම ශාස්ත්‍රීය ලෝකය තුළ අතිශය සාධනීය බලපෑමක් සිදුකරන බව පෙන්වා දීම වැදගත් ය.

මෙම අදහස් ආශ්‍රයෙන් සලකා බලන කල පැහැදිලි වන්නේ ග්‍රාම්ස්චිගේ අරුතින් හෙජමනිය යන්න බහුමානීය සංකල්පයක් බව යි. එමඟින් යම් සමාජ කණ්ඩායමක අධිපතිත්වය පිළිබඳ සංයුක්ත අදහසක් ලබා දෙන අතර ම එක්තරා ආකාරයකින් ක්‍රමවේදීමය වශයෙන් එම අධිපතිත්වය ගොඩනගා ගැනීමේ විධික්‍රම ද විස්තර කරයි. මේ නිසා ම සමාජ විද්‍යාත්මක වශයෙන් මෙම සංකල්පය පිළිබඳ වටහා ගැනීමේ දී න්‍යායාත්මක මෙන් ම ක්‍රමවේදමය වශයෙන් ද එක්තරා ආකාරයක ශාස්ත්‍රීය සහායක් එමඟින් පිරිනමන බව පැහැදිලි ය. මෙනිසා ම යම් සමාජ පන්තියක්, ප්‍රජාවක් සතු බලය සුජාතභාවයට පත්වන ආකාරය මෙන් ම එම බලය සුජාතභාවය දක්වා ඔසවා තබන මාර්ගය පිළිබඳ සංයුක්ත විශ්ලේෂණයක් සඳහා අවශ්‍ය ක්‍රමවෙදමය සහ සංකල්පීය සහාය ග්‍රාම්ස්චි වෙතින් ලබාගත හැකි ය.

## 4.නිගමනය

මෙම ලිපිය තුළ සාකච්ඡා කෙරුණු කරුණු ආශ්‍රයෙන් එළඹිය හැකි සාධාරණ නිගමන කිහිපයක් තිබේ. ඉතාලියානු ජාතික අන්තෝනියෝ ග්‍රාම්ස්චි යනු නව මාක්ස්වාදී න්‍යායික ධාරාවට, බටහිර මාක්ස්වාදයට මෙන්ම ව්‍යුහවාදී අදහස්වලට සුවිශාල බලපෑමක් කළ න්‍යායධරයෙකි; දේශපාලන ක්‍රියාධරයෙකි. එහෙත් ශාස්ත්‍රීය ලෝකය කෙරෙහි ග්‍රාම්ස්චියානු මැදිහත්වීම ඉතා සරල අර්ථයෙන් බෙදා වෙන් කොට දැක්විය නොහැකි පුළුල් ක්ෂේත්‍ර ගණනාවක් පුරා ව්‍යාප්ත වී තිබෙයි. අනෙක් අතින් ග්‍රාම්ස්චියානු මැදිහත්වීම න්‍යායික සහ ප්‍රායෝගික දේශපාලනය යන අංශ ද්වය කෙරෙහි ම එක හා සමාන බලපෑමක් සිදු කරයි. ග්‍රාම්ස්චිගේ අදහස් අතුරින් හෙජමනිය යන සංකල්පය ඉතා බරපතල අයුරින් වර්තමාන ශාස්ත්‍රීය ලෝකය වෙත ආලෝකයක් සපයන අතර ම එමඟින් පුද්ගලයා වටා වූ බලය, නිලීන බල සබඳතා වටහා ගැනීම සඳහා මෙන් ම ප්‍රයෝගික වශයෙන් විප්ලවීය දේශපාලන ලෝකයට දැක්මක් ද ලබා දෙයි. විශේෂයෙන් සමාජ විද්‍යාව සහ පොදුවේ සමාජීය විද්‍යා තුළ නිරන්තර වශයෙන් අවධානයට පාත්‍ර වන ස්ත්‍රී-පුරුෂ සමාජභාවීය අසමානතා, ජනමාධ්‍ය හැසිරීම, පක්ෂ දේශපාලනය සහ ගෝලීය දේශපාලන පර්යාය වටහා ගැනීමෙහි ලා මෙම සංකල්පය විසින් පැහැදිලි න්‍යායික සහ සංකල්පමය සහායක් ලබා දෙයි. විශේෂයෙන් සමාජ ව්‍යුහය තුළ පවතින දෘෂ්ටිවාදී තත්ත්වයන්, ඇගයුම්, ප්‍රතිමාන මෙන් ම එම තත්ත්වයන් පුද්ගල සබඳතා සහ අන්තර්ක්‍රියා විෂයෙහි ක්‍රියාකරන ආකාරය මෙන් ම පුද්ගලයෙකු හෝ සමාජ කණ්ඩායමක ආස්ථානය තීරණය වීම කෙරෙහි ඒවායේ බලපෑම ද මෙම මාර්ගය ඔස්සේ විවේචනාත්මක ව වටහා ගැනීමේ හැකියාවක් පවතී. එය එක්තරා ආකාරයකින් න්‍යායාත්මක සහ සංකල්පීය රාමුවක් මෙන් ම ක්‍රමවේදමය වශයෙන් ද වඩා වැදගත් අවබෝධයක් ගොඩනගන බව දැක්විය හැකි ය. මේ අනුව පොදුවේ පෙන්වා දිය හැක්කේ ග්‍රාම්ස්චියානු සංකල්පගතකරණයන් සමකාලීන ඉතාලියානු සහ බටහිර සමාජය ආශ්‍රයෙන් ගොඩනැගුණ ද වර්තමාන ශාස්ත්‍රීය සහ ක්‍රියාකාරී දේශපාලන තලය සහ එම

ප්‍රපංචයන් වෙත ඉන් ඇති ව තිබෙන පැහැදිලි බලපෑම ආශ්‍රයෙන් සලකා බලන කල ග්‍රාම්ස්චිගේ මැදිහත්වීම සහ ඔහුගේ රචනා ශෛලීය සහ බහුමානීය, බහුවිෂයීය පර්යාලෝකයක් සනිටුහන් කරන බව ය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


Althusser, L. (1969). *For Marx.* (B. Brewster, Trans.) New York: British Library Cataloguing in Publication Data.

Boothman, D. (2008 ). The Sources for Gramsci’s Concept of. *RETHINKING MARXISM, 20* .

Budgeon, S. (n.d.). The Dynamics of Gender Hegemony: Femininities, Masculinities and Social Change. *Sociology, 48*. Retrieved from https://www.jstor.org/stable/24433249

Christopher Chase-Dunn, Peter Taylor, Giovanni Arrighi, Robert Cox, & Henk. (1994). Hegemony and Social Change. *Mershon International Studies Review, 38* . Retrieved 22-04-2020

Engels, K. M. (1888). *The Communist Manifesto* (Vol. 1). (S. Moore, Trans.) London : Progess Publishers .

Ernesto Laclau, & Mouffe Chantal. (1992 ). *Hegemony and Socialist Strategy:Towards a Radical Democratic Politics.* London: Verso.

Fontana, B. (1993). *Hegemony and Power: On the Relation between Gramsci and Machiavelli.* Minneapolis: The University of Minnesota Press.

Gramsci, A. (1999). *Prison Notebook of Antonio Gramsci* . (Q. H. Smith, Ed., & Q. H. Smith, Trans.) London: The Electric Book Company Ltd .

Gramsci, A. (2000). *THE GRAMSCI READER: Selected Writings 1916-1935.* (D. FORGACS, Ed.) New York: NEW YORK UNIVERSITY PRESS.

Gündoğan, E. (2008). Conceptions of Hegemony in Antonio Gramsci’s Southern. *New Proposals: Journal of Marxism and Interdisciplinary Inquiry, 1* , 45-65 .

Herrmann, A. (2017). Hegemony . (C. R. Lewis, Ed.) *Te International Encyclopedia of Organizational Communication*.

Ives, P. (2004 ). *Language and Hegemony in Gramsci.* Pluto Press. Retrieved from https://www.jstor.org/stable/j.ctt183q4d3.10

Lears, T. J. (1985). The Concept of Cultural Hegemony: Problems and Possibilities. *The American Historical Review*, 567-593. Retrieved from Oxford University Press on behalf of the American Historical Association: http://www.jstor.org/stable/1860957

Ledwith, M. (2009 ). Antonio Gramsci and Feminism: The elusive nature of power. *Educational Philosophy and Theory, 41* .

Mayo, P. (2015). *Hegemony and Education under Neoliberalism: mInsights from Gramsci.* (D. Hill, Ed.) New york: Routledge.

Peet, R., & Harwich, E. (2009) *Theories of Development: Contentions, Argument, Alternatives*. NewYork: The Guilford Press.

Richard Bellamy, & Darrow Schecter. (1993). *Gramsci and the Italian State.* Manchester: Manchester University Press.

Riley, D. J. (2011). Hegemony, Democracy, and Passive Revolution in Gramsci's Prison Notebooks. *California Italian Studies, 2(2)*. Retrieved 04 05, 2020, from http://escholarship.org/uc/item/5x48f0mz

Sperber, G. H. (2016). *An Introduction to Antonio Gramsci : His Life, Thought and Legacy*. New York: Bloomsbury.

ගුණසිංහ, එන්. (2011). නිව්ටන් ගුණසිංහ තෝරාගත් ලිපි 1 . ( ආර්. පෙරේරා, සංස්.) කොළඹ: සමාජ විද්‍යාඥයින්ගේ සංගමය .

චාමින්ද, ඒස්. (2019). අන්තෝනියෝ ග්‍රාම්ස්චි (ජීවිතය චින්තනය දේශපාලනය. මහරගම. අහස මීඩියා වර්කස්.